# වසර මැද
# රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව
# 2022

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව

# වසර මැද
# රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව-2022

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ
10 වෙනි වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

**රනිල් වික්‍රමසිංහ, පා.ම.**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය**

2022 ජූනි 30

# වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව-2022

**2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ**
**10 වැනි වගන්තිය යටතේ**
**ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.**

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 10 වැනි වගන්තියට අනුව, වසර මැද රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සම්බන්ධයෙන් වන වාර්තාවක් මුදල් අමාත්‍යවරයා විසින් අදාළ වසරේ ජූනි මස අවසාන දිනය වන විට මහජනතාවගේ දැන ගැනීම සඳහා නිකුත් කිරීමටත්, ඉන් ඉක්බිතිව එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය බව දැක්වේ.

රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය අනුව රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම්වල යාවත්කාලීන තොරතුරු සැපයීම මෙම වාර්තාවේ අරමුණ වේ.

2022 වසරේ පළමු මාස හතර තුළ රජයේ ආදායම, වියදම, මුදල් ප්‍රවාහ කටයුතු හා ණය ගැනීම් පිළිබඳ කාර්යසාධනය මෙම වාර්තාවේ ඇතුළත් වේ. 2022 වසරේ පළමු මාස හතර සඳහා වන අයවැය තත්ත්වය පිළිබඳ තාවකාලික දත්ත ද ලබාගත හැකි තොරතුරු අනුව සාර්ව ආර්ථික කටයුතුවල කාර්යසාධනය, මිල ගණන් වෙනස්වීම්, විදේශ මූල්‍යනය, රාජ්‍ය ණය, නිල සංචිත සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ කාර්ය සාධනය පිළිබඳ තොරතුරු ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

# පටුන

පිටු අංකය


| | | |
|---|---|---|
| 1 වන පරිච්ඡේදය | **ආර්ථික සන්දර්භය** | 1 |
| | සමාලෝචනය | 1 |
| | ගෝලීය ආර්ථිකය සහ ශ්‍රී ලංකා සන්දර්භය තුළ ඉදිරි දැක්ම | 2 |
| 2 වන පරිච්ඡේදය | **රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා** | 5 |
| | සමාලෝචනය | 5 |
| | රාජ්‍ය ආදායම | 7 |
| | රාජ්‍ය වියදම | 16 |
| | භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය | 22 |
| 3 වන පරිච්ඡේදය | **රජය සතු ව්‍යාපාරයන්හි කාර්යසාධනය** | 25 |
| | සමාලෝචනය | 25 |
| | රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය | 25 |
| 4 වන පරිච්ඡේදය | **විදේශ මූල්‍යයනය** | 33 |
| | සමාලෝචනය | 33 |
| | විදේශ මූල්‍යයන එකඟතා | 33 |
| | විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජන | 33 |
| | එකඟතා පළකරන ලදුව ඉදිරියේ දී උපයෝජනය වීමට නියමිත ශේෂය | 35 |
| | විදේශ ණය ප්‍රමාණය සහ විදේශ ණය සේවාකරණය | 35 |

## මූලික ආර්ථික දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකකය | වටිනාකම | |
|---|---|---|---|---|
| | | | 2021 | 2022 (තාවකාලික) |
| **මූර්ත අංශය** | | | | |
| ආර්ථික වර්ධනය | පළමු කාර්තුව | % | 4.0 | -1.6 |
| කෘෂිකර්මාන්ත | පළමු කාර්තුව | % | 6.4 | -6.8 |
| කර්මාන්ත | පළමු කාර්තුව | % | 6.0 | -4.7 |
| සේවා | පළමු කාර්තුව | % | 3.5 | 0.7 |
| උද්ධමනය (ලක්ෂ්‍යමය) | මැයි අවසානයට | % | 4.5 | 39.1 |
| උද්ධමනය (සාමාන්‍යය) | මැයි අවසානයට | % | 3.9 | 14.2 |
| සේවා වියුක්ති අනුපාතය | වාර්ෂික | % | 5.1 | ලැ.නො. |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය | වාර්ෂික | % | 49.9 | ලැ.නො. |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | |
| අයවැය හිඟය | ජන-අප්‍රේල් | රු.මිලි. | -520,543 | -524,100 |
| මුළු ආදායම | ජන-අප්‍රේල් | රු.මිලි. | 481,722 | 630,908 |
| බදු ආදායම | ජන-අප්‍රේල් | රු.මිලි. | 427,261 | 543,649 |
| බදු නොවන ආදායම | ජන-අප්‍රේල් | රු.මිලි. | 54,461 | 87,259 |
| වර්තන වියදම | ජන-අප්‍රේල් | රු.මිලි. | 890,085 | 1,016,810 |
| රාජ්‍ය ආයෝජන | ජන-අප්‍රේල් | රු.මිලි. | 114,227 | 140,999 |
| රාජ්‍ය ණය | දෙසැම්බර් අවසානයට | රු.බිලි. | 17,589 | ලැ.නො. |
| **විදේශ අංශය** | | | | |
| අපනයන | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 3,800.3 | 4,219.1 |
| එයින් කෘෂි අපනයන | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 829.4 | 783.5 |
| කාර්මික අපනයන | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 2,949.4 | 3,416.9 |
| රෙදිපිළි හා ඇඟළුම් | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,699.5 | 1,924.6 |
| වෙනත් | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,249.9 | 1,492.3 |
| ආනයන | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 6,748.1 | 7,350.2 |
| පාරිභෝගික භාණ්ඩ | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,276.5 | 1,176.6 |
| අන්තර් භාණ්ඩ | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 4,065.7 | 4,806.6 |
| එයින් ඛනිජ නිෂ්පාදන | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,390.3 | 1,922.4 |
| ආයෝජන භාණ්ඩ | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,403.1 | 1,365.2 |
| වෙළෙඳ ශේෂය | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | -2,947.8 | -3,131.1 |
| සංචාරක පැමිණීම් | ජන-මැයි | සංඛ්‍යාව | 15,294 | 378,521 |
| සංචාරක ඉපැයීම් | ජන-මැයි | ඇ.ඩො.මිලි. | 39.9[අ] | 680.7 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | ජන-මැයි | ඇ.ඩො.මිලි. | 2,845.9 | 1,335.6 |
| කොටස් වෙළඳපොළ විවිධ අයෝජන (ශුද්ධ) | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | -107 | 92 |
| සමස්ථ ගෙවුම් ශේෂය | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | -929 | -2,569 |
| දළ නිල සංචිත | අප්‍රේල් අවසානයට | ඇ.ඩො.මිලි. | 4,471 | 1,812 |
| විනිමය අනුපාතය (මාසය අග) | මැයි අවසානයට | ඇ.ඩොලරයට රුපියල් | 199.50 | 360.76 |
| විනිමය අනුපාතය (මාසික සාමාන්‍යය) | ජන-මැයි | ඇ.ඩොලරයට රුපියල් | 199.58 | 358.93 |
| **මූල්‍ය අංශය** | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය | මැයි අවසානයට | % | 4.50 | 13.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතය | මැයි අවසානයට | % | 5.50 | 14.50 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය | මැයි අවසානයට | % | 2.00 | 4.00 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය | මැයි අවසානයට | % | 5.65 | 22.11 |
| වාණිජ බැංකු වල බරිත සාමාන්‍ය ණය අනුපාතය | අප්‍රේල් අවසානයට | % | 9.73 | 11.31 |
| ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (මාස 01) | ජූනි අවසානයට | % | 6.05 | 6.05 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 91) | මැයි අවසානයට | % | 5.13 | 23.65 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 364) | මැයි අවසානයට | % | 5.18 | 24.30 |
| මුදල් සැපයුම් වර්ධනය ($M_2b$) | 2022 අප්‍රේල්/2021 අප්‍රේල් | % | 20.4 | 20.0 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය | 2022 අප්‍රේල්/2021 අප්‍රේල් | % | 8.2 | 20.3 |

(අ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.

## ශ්‍රී ලංකාව : තෝරාගත් දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකකය | වටිනාකම |
|---|---|---|---|
| විදුලි බලය | | | |
| විදුලි බලය සඳහා ඇති ප්‍රවේශය | 2016 | % | 99.3 |
| ජලය | | | |
| පිරිසිදු පානීය ජල සැපයුම් සඳහා ප්‍රවේශය | 2021 | ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස | 94.4 |
| නල ජල පහසුකම් සඳහා ප්‍රවේශය | 2021 | ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස | 54.3 |
| මාර්ග | | | |
| මාර්ග ඝනත්වය | 2021 | වර්ග කි.මී. | 0.19 |
| මාර්ගවල මුළු දිග | 2021 | කි.මී. | 12,537 |
| සන්නිවේදනය | | | |
| ජංගම දුරකථන ඇතුළුව දුරකථන ඝනත්වය | 2021 | පුද්ගලයින් 100 කට | 148.1 |
| අන්තර්ජාලය සඳහා ප්‍රවේශය | 2021 | පුද්ගලයින් 100 කට | 100.4 |
| අධ්‍යාපනය | | | |
| **පොදු අධ්‍යාපනය** | | | |
| ප්‍රාථමික පාසල් සඳහා ඇතුළත්වීමේ අනුපාතය | 2021 | % | 94.4 |
| ගුරු/ශිෂ්‍ය අනුපාතය (රජයේ පාසැල්) | 2021 | සංඛ්‍යාව | 16.0 |
| සාක්ෂරතා අනුපාතය (සාමාන්‍යය) | 2020 | % | 93.0 |
| පරිගණක සාක්ෂරතාව (පළමු මාස 6) | 2021 | % | 35.0 |
| **විශ්ව විද්‍යාල අධ්‍යාපනය** | | | |
| ගුරු/ශිෂ්‍ය අනුපාතය | 2021 | සංඛ්‍යාව | 19.7 |
| වයස් විශේෂිත ලියාපදිංචි අනුපාතය (වයස අවුරුදු 19-23) (අ) | 2021 | % | 8.7 |
| සෞඛ්‍ය | | | |
| රෝහල් (බටහිර වෛද්‍ය)(ආ) | 2021 | සංඛ්‍යාව | 618 |
| ඇඳන්(ආ) | 2021 | සංඛ්‍යාව | 78,228 |
| රෝහල් ඇඳන් | 2020 | පුද්ගලයින් 1,000 කට | 3.5 |
| වෛද්‍යවරයෙක් සඳහා පුද්ගලයින් | 2020 | සංඛ්‍යාව | 1,167 |
| ජනගහනය | | | |
| ජනගහන ඝනත්වය | 2021 | වර්ග කි.මීටරයට පුද්ගලයින් | 353 |
| මධ්‍ය වාර්ෂික ජනගහන වර්ධනය | 2021 | % | 1.1 |
| උපතේදී ආයු අපේක්ෂාව | 2017 | අවුරුදු | 75.5 |
| ළදරු මරණ අනුපාතිකය | 2015 | සජීවී උපත් 1,000 කට | 7.5 |
| මාතෘ මරණ අනුපාතිකය | 2013 | සජීවී උපත් 1,000 කට | 26.8 |
| දළ උපත් අනුපාතිකය | 2021 | පුද්ගලයින් 1,000 කට | 12.9 |
| දළ මරණ අනුපාතිකය | 2021 | පුද්ගලයින් 1,000 කට | 7.4 |
| යැපුම් අනුපාතිකය | 2021 | % | 49.4 |
| දරිද්‍රතාව | | | |
| දරිද්‍රතා දර්ශකය | 2019 | % | 14.3 |
| ගෘහ ඒකක ආදායමෙහි ගිනි සංගුණකය | 2019 | සංගුණකය | 0.46 |
| දරිද්‍රතා පරතර දර්ශකය | 2019 | % | 0.6 |
| දිනකට ලබා ගන්නා සාමාන්‍ය කැලරි ප්‍රමාණය | 2019 | කිලෝකැලරි | 2,120 |
| ජාත්‍යන්තර ශ්‍රේණි ගත කිරීම් | | | ස්ථානය |
| මානව සංවර්ධන දර්ශකය | 2020 | රටවල් 189 ක් අතරින් ස්ථානය | 72 |
| ව්‍යාපාර පවත්වා ගෙන යාමේ දර්ශකය | 2020 | රටවල් 190 ක් අතරින් ස්ථානය | 99 |
| ගෝලීය තරඟකාරීත්ව දර්ශකය | 2019 | රටවල් 141 ක් අතරින් ස්ථානය | 84 |
| ආර්ථික නිදහස් දර්ශකය | 2021 | රටවල් 177 ක් අතරින් ස්ථානය | 132 |
| ගෝලීය සාම දර්ශකය | 2021 | රටවල් 163 ක් අතරින් ස්ථානය | 95 |
| ඊ-රාජ්‍ය සංවර්ධන දර්ශකය | 2020 | රටවල් 193 ක් අතරින් ස්ථානය | 85 |

(අ) අභ්‍යන්තර ලියාපදිංචි වූ සිසුන් පමණක් ඇතුළත් වේ
(ආ) රජයේ

# 1 වන පරිච්ඡේදය
# ආර්ථික සන්දර්භය

## සමාලෝචනය

මෙතෙක් වාර්තා කළ ඉහළම උද්ධමන අගයන්, අත්‍යවශ්‍ය භාණ්ඩයන්හි හිඟය සහ බලශක්ති සැපයුමේ බාධාවන් සමඟින් ශ්‍රී ලංකාව මේ වන විට පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් සිටී. දේශීය වශයෙන් ඇති වූ අහිතකර තත්ත්වයන් සහ ගෝලීය සැපයුම කෙරෙහි බලපෑ සාධක පවතින අර්බුදයට හේතු වී ඇත. ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ දිගින් දිගටම පවතින හිඟය, භාණ්ඩ මිල ඉහළ යාම සහ අඩු වූ විදේශ සංචිත, රුපියල විශාල ලෙස අවප්‍රමාණය වීමට හේතු වී ඇත. විදේශ ණය කල්පිරීම් පියවීම සහ අත්‍යවශ්‍ය ආනයන අවශ්‍යතා සපුරාලීම සඳහා සංචිත යොදා ගැනීම හේතුවෙන් භාවිත කළ හැකි විදේශ සංචිත ශුන්‍ය අගයක් දක්වා ළඟා වී ඇත. රාජ්‍ය මූල්‍ය තත්ත්වය සැලකිය යුතු ලෙස දුර්වල වීම හේතුවෙන් රාජ්‍ය ණය තිරසාර නොවන මට්ටමකට පැමිණ තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහාය දක්වනු ලබන ආර්ථිකය යථාවත් කිරීමේ වැඩසටහනකට අනුකූල වන පරිදි ක්‍රමානුකූලව සහ එකඟතාවයෙන් යුතුව ණය ප්‍රතිව්‍යූහගත කරන තෙක්, තෝරාගත් විදේශ ණය ආපසු ගෙවීම් තාවකාලිකව අත්හිටුවන බව රජය විසින් නිවේදනය කර ඇත.

රාජ්‍ය මූල්‍ය අංශයේ දුර්වලතාවය ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික අස්ථාවරත්වයන් බොහෝමයකට මූලික හේතුවක් වී ඇති බැවින් මූලික වශයෙන් ආදායම් ඉහළ නැංවීම සමඟ වියදම් තාර්කිකරණය කිරීම පදනම් කර ගත් නව රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා රාමුවක් රජය විසින් අනුගමනය කර ඇත. අත්‍යවශ්‍ය නොවන ප්‍රාග්ධන වියදම් හා ව්‍යාපෘති සඳහා වියදම් කල් දැමීම සහ අතිකාල ගෙවීම් සම්බන්ධයෙන් දැඩි පාලනයක් ඇතුළුව පුනරාවර්තන වියදම් තාර්කිකරණය කිරීම මඟින් රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා රජය විසින් 2022 වසරේ අප්‍රේල් මාසයේ දී නව චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. 2022 මැයි 31 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය නැවත ස්ථාපිත කිරීම සඳහා බදු ප්‍රතිසංස්කරණ කිහිපයක් අනුමත කරන ලද අතර, මිල සූත්‍රයක් මත පදනම් වූ පිරිවැය නිරූපිත ඉන්ධන මිලකරණය ද නැවත හඳුන්වා දෙන ලදී.

ඉදිරි කාලපරිච්ඡේදය තුළ තවදුරටත් තීව්‍ර විය හැකි උද්ධමන පීඩනය අඩු කිරීමට සහ විදේශ අංශයේ අසමතුලිතතා ලිහිල් කිරීම වෙනුවෙන් මුදල් ප්‍රතිපත්තිය දැඩි කරන ලදී. ඒ අනුව, 2022 අප්‍රේල් 08 දින සිට බල පැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙළින්, සියයට 13.50 ක් සහ සියයට 14.50 ක් දක්වා පදනම් අංක 700 කින් සැලකිය යුතු ලෙස ඉහළ නංවන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳපොළ පොළී අනුපාත ව්‍යුහයේ පැවති ඇතැම් විෂමතා නිවැරදි කරමින් මූල්‍ය ආයතනවල තැන්පතු සහ ණය සඳහා වන පොළී අනුපාතයන් කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීමක් වාර්තා කළේය. මෙම ප්‍රතිපත්ති දැඩි කිරීමේ ක්‍රියාමාර්ගයන්ට ප්‍රතිචාර වශයෙන් රජයේ සුරැකුම්පත්වල ද එළදා අනුපාතික ඉහළ යෑමක් දක්නට ලැබුණු නමුත්, ඉහළ යන පොළී අනුපාත සහ දුර්වල ආර්ථික අපේක්ෂා හේතුවෙන් කොටස් වෙළෙඳපොළ පෙර පැවති වාර්තාගත ඉහළ මට්ටම්වල සිට පසුබෑමක් වාර්තා කරන ලදී.

මේ අතර, ප්‍රධාන වශයෙන් ආහාර හා ආහාර නොවන අංශයන්ගේ උද්ධමනය ඉහළ යාම හේතුවෙන් කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද. 2013=100) මඟින් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මනිනු ලබන මතුපිට උද්ධමනය 2022 මැයි මාසයේ දී සියයට 39.1 සිට 2022 ජූනි මාසයේ දී සියයට 54.6 ක් දක්වා වැඩි විය. වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආහාර උද්ධමනය 2022 මැයි මාසයේ දී සියයට 57.4 සිට 2022 ජූනි මාසය වන විට සියයට 80.1 දක්වාත්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආහාර නොවන උද්ධමනය 2022 මැයි මාසයේ දී සියයට 30.6 සිට 2022 ජූනි මාසය වන විට සියයට 42.4 දක්වාත් වැඩි විය.

ප්‍රධාන වශයෙන්ම ගෝලීය භාණ්ඩ මිල ඉහළ යාම හේතුවෙන් ආනයන වියදම ඉහළ මට්ටමක පැවති අතර, විදේශ ප්‍රේෂණ ඇතුළු ප්‍රධාන ගලා ඒම් පහළ යාම සහ දෙවන කාර්තුවේ සිට සංචාරක ඉපැයීම් අඩු වීම හේතුවෙන් විදේශ අංශය 2022 වසරේ පළමු මාස හතර තුළ අඛණ්ඩව බොහෝ අභියෝගයන්ට මුහුණ දෙන ලදී. 2022 වසරේ ආරම්භයේ සිට මැයි මස 13 දක්වා ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 44.3 ක අවප්‍රමාණයවීමක් වාර්තා කර තිබේ. කොවිඩ්-19 වසංගතය ආශ්‍රිතව ඇති වූ සැපයුම් සහ ඉල්ලුම් කම්පන සහ භූ දේශපාලනික අර්බුද සමඟ ගෝලීය වෙළෙඳපොළේ ඉන්ධන මිල ඇතුළුව භාණ්ඩ මිල ගණන් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස විදේශ අංශය දැඩි අවදානම් තත්ත්වයකට මුහුණ පා ඇත.

කාර්මික අපනයනවල ඉහළ ඉපැයීම් හේතුවෙන් අපනයන ආදායම 2021 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 3,800 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 4,219 දක්වා සියයට 11.0 කින් ඉහළ ගියේය. විශේෂයෙන් ගෝලීය වෙළෙඳපොළේ භාණ්ඩ මිල ඉහළ යාම හේතුවෙන් ආනයන මත වියදම 2021 වසරේ පළමු මාස හතර තුළ වූ ඇ. ඩො. මිලියන 6,748 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 7,350 දක්වා සියයට 8.9 කින් ඉහළ ගියේය. ඒ අනුව, වෙළඳ හිඟය 2021 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 2,948 ක හිඟයක සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 3,131 දක්වා පුළුල් විය. දෙවන විශාලතම විදේශ මුදල් ඉපැයීම් ප්‍රභවය වන විදේශ ප්‍රේෂණ, 2021 වසරේ පළමු මාස පහ තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 2,845.9 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 1,335.6 දක්වා සියයට 53.1 කින් සැලකිය යුතු ලෙස පහත ගොස් ඇත.

**වගුව 1.1:** උද්ධමනයේ විචලනය (%)

| | | කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100) | | | | ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | මතුපිට උද්ධමනය | | මූලික උද්ධමනය* | | මතුපිට උද්ධමනය | | මූලික උද්ධමනය* | |
| | | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍ය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍ය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍ය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍ය |
| 2021 | ජනවාරි | 3.0 | 4.3 | 2.7 | 3.1 | 3.7 | 5.8 | 4.2 | 4.2 |
| | පෙබරවාරි | 3.3 | 4.1 | 2.6 | 3.0 | 4.2 | 5.5 | 4.1 | 4.2 |
| | මාර්තු | 4.1 | 4.0 | 3.1 | 3.0 | 5.1 | 5.3 | 4.3 | 4.3 |
| | අප්‍රේල් | 3.9 | 3.9 | 3.0 | 3.0 | 5.5 | 5.3 | 4.1 | 4.4 |
| | මැයි | 4.5 | 3.9 | 3.2 | 3.0 | 6.1 | 5.4 | 4.2 | 4.4 |
| | ජුනි | 5.2 | 4.1 | 3.2 | 3.0 | 6.1 | 5.4 | 4.1 | 4.4 |
| | ජූලි | 5.7 | 4.2 | 3.7 | 3.1 | 6.8 | 5.4 | 4.4 | 4.4 |
| | අගෝස්තු | 6.0 | 4.3 | 4.1 | 3.2 | 6.7 | 5.5 | 4.7 | 4.4 |
| | සැප්තැම්බර් | 5.7 | 4.5 | 5.0 | 3.3 | 6.2 | 5.5 | 4.8 | 4.4 |
| | ඔක්තෝබර් | 7.6 | 4.8 | 6.3 | 3.6 | 8.3 | 5.7 | 7.2 | 4.6 |
| | නොවැම්බර් | 9.9 | 5.3 | 7.0 | 4.0 | 11.1 | 6.2 | 8.8 | 5.0 |
| | දෙසැම්බර් | 12.1 | 6.0 | 8.3 | 4.4 | 14.0 | 7.0 | 10.8 | 5.5 |
| 2022 | ජනවාරි | 14.2 | 6.9 | 9.9 | 5.0 | 16.8 | 8.1 | 12.9 | 6.2 |
| | පෙබරවාරි | 15.1 | 7.9 | 10.9 | 5.7 | 17.5 | 9.3 | 14.1 | 7.1 |
| | මාර්තු | 18.7 | 9.1 | 13.0 | 6.5 | 21.5 | 10.6 | 17.3 | 8.2 |
| | අප්‍රේල් | 29.8 | 11.3 | 22.0 | 8.1 | 33.8 | 13.0 | 27.9 | 10.2 |
| | මැයි | 39.1 | 14.2 | 28.4 | 10.2 | 45.3 | 16.3 | 37.7 | 13.0 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

* කොළඹ පාරිභෝගික මිල දර්ශකය, ජාතික පාරිභෝගික මිල දර්ශකය *(2013=100)*-ආහාර, බලශක්ති සහ ප්‍රවාහනය යන නිතර වෙනස් වන අයිතමයන් හැර

සංචාරක ඉපැයීම් 2021 වසරේ පළමු මාස පහ තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 39.9 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 680.7 දක්වා ඉහළ ගියද, එය පූර්ව වසංගත මට්ටමට සාපේක්ෂව ඉතා පහළ අගයක පවතී. ගෝලීය සහ දේශීය සාධක හේතුවෙන් සංචාරක අංශයේ කෙටිකාලීන ඉදිරි දැක්ම අහිතකර ලෙස පවතිනු ඇතැයි අපේක්ෂිතය. උපයෝගීතාවය පිළිබඳ කොන්දේසි මත පදනම් වූ ඇ. ඩො. බිලියන 1.5 ක් පමණ වන චීන මහජන බැංකුවේ මුදල් හුවමාරු පහසුකම ඇතුළුව රටේ සමස්ත සංචිත 2022 වසරේ අප්‍රේල් මස අවසන් වන විට ඇ. ඩො. බිලියන 1.8 ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් සහාය දෙනු ලබන සාර්ව ආර්ථික වැඩසටහනක් සඳහා දැනටමත් සිදු කෙරෙන සාකච්ඡා සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය රටෙහි ස්ථාවරත්වය නැවත ස්ථාපිත කිරීමට, විශ්වසනීයත්වය සහ ශ්‍රී ලංකාවේ ස්වෛරී ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමට සහ ගෝලීය ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත ප්‍රවේශය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් කිරීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## ගෝලීය ආර්ථිකය සහ ශ්‍රී ලංකා සන්දර්භය තුළ ඉදිරි දැක්ම

ඉහළ උද්ධමන සහ ගෙවුම් ශේෂ පීඩනය තවදුරටත් වැඩි කරමින්, රුසියානු-යුක්රේන ගැටුමෙහි බලපෑම් ශ්‍රී ලංකාවේ ආර්ථික අවදානම් වඩාත් තීව්‍ර කිරීමට හේතු වී ඇත. රුසියාව සහ යුක්රේනය, කෘෂිකාර්මික නිෂ්පාදන, ස්වාභාවික වායු සහ බොර තෙල්, යුරෝපීය රටවලට සහ ඇමෙරිකා එක්සත් ජනපදයට සපයන ප්‍රධාන සැපයුම්කරුවන් වන බැවින්, රුසියාවට එරෙහි සම්බාධක සමඟ ඇති වූ සැපයුම් අවහිරතා ගෝලීයව ආහාර සහ ඉන්ධන මිල ඉහළ යාමට දැඩි ලෙස බලපා ඇත. ගෝලීය වශයෙන් වැයකළ හැකි ආදායම (disposable income) අඩු වූ බැවින්, ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන ඇඟලුම් වැනි නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැකිය. භාණ්ඩ මිල ඉහළ යාමද, ශ්‍රී ලංකාවේ ඉහළ මිල මට්ටම්වලට සහ උද්ධමනකාරී පීඩනයන්ට හේතු වී තිබේ.

විදේශීය අංශයේ මෙම අහිතකර ප්‍රවණතාවන්ට මුහුණ දීම සඳහා භාණ්ඩ අපනයනයන්ට සහ තොරතුරු තාක්ෂණ, සංචාරක හා සැපයුම් වැනි සේවා අපනයනයන්ට සහාය වෙමින් අඛණ්ඩව අපනයන අංශයේ ආයෝජනය කිරීම ශ්‍රී ලංකාවට වැදගත් වේ. සංචිත නැවත ගොඩ නැගීම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ශක්තිමත් කිරීම සහ ගෝලීය ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත ප්‍රවේශය නැවත ලබා ගැනීම සඳහා සංවර්ධන පාර්ශවකරුවන්ගෙන් නව මූල්‍යකරණය ලබා ගැනීමේ පළමු පියවර ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ වැඩසටහනකට එළඹීම මගින් කෙටි කාලීනව ගෙවුම් ශේෂය හිතකර ලෙස පවත්වා ගෙන යාමට සහාය වීමට ශ්‍රී ලංකාවට සිදුවනු ඇත.

වගුව 1.2: 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා විදේශ වෙළඳාම

ඇ.ඩො. මිලියන

| අයිතමය | 2021 | 2022 (තාවකාලික) | වෙනස % |
|---|---|---|---|
| **අපනයන** | **3,800.3** | **4,219.1** | **11.0** |
| කෘෂිකාර්මික නිෂ්පාදන | 829.4 | 783.5 | -5.5 |
| තේ | 417.4 | 367.2 | -12.0 |
| ප්‍රාථමික නිෂ්පාදන (රබර් හා පොල් නිෂ්පාදන) | 139.0 | 156.6 | 12.7 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 273.0 | 259.7 | -4.9 |
| කාර්මික නිෂ්පාදන | 2,949.4 | 3,416.9 | 15.9 |
| රෙදි පිළි හා ඇඟලුම් | 1,699.5 | 1,924.6 | 13.2 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 122.1 | 238.0 | 94.9 |
| අනෙකුත් කාර්මික නිෂ්පාදන | 1,127.8 | 1,254.3 | 11.2 |
| ඛනිජ නිෂ්පාදන | 16.0 | 12.3 | -23.1 |
| අනෙකුත් | 5.6 | 6.4 | 14.3 |
| **ආනයන** | **6,748.1** | **7,350.2** | **8.9** |
| පාරිභෝගික භාණ්ඩ | 1,276.5 | 1,176.6 | -7.8 |
| ආහාර හා පාන වර්ග | 628.8 | 660.6 | 5.1 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 647.7 | 516.0 | -20.3 |
| අතරමැදි භාණ්ඩ | 4,065.7 | 4,806.6 | 18.2 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 1,390.3 | 1,922.4 | 38.3 |
| පොහොර | 82.2 | 42.1 | -48.8 |
| රෙදි පිළි හා ඇඟලුම් | 938.6 | 1,161.7 | 23.8 |
| අනෙකුත් අතරමැදි භාණ්ඩ | 1,654.6 | 1,680.4 | 1.6 |
| ආයෝජන භාණ්ඩ | 1,403.1 | 1,365.2 | -2.7 |
| යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 913.0 | 874.8 | -4.2 |
| ප්‍රවාහන උපකරණ | 107.7 | 71.2 | -33.9 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 381.8 | 417.4 | 9.3 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 0.6 | 1.8 | 200.0 |
| අනෙකුත් | 2.8 | 1.8 | -35.7 |
| **වෙළඳ ශේෂය** | **-2,947.8** | **-3,131.1** | **-6.2** |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

# 2 වන පරිච්ඡේදය
# රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා

## සමාලෝචනය

2022 වසරේ පළමු මාස හතර තුළ රාජ්‍ය මූල්‍ය අංශය අඛණ්ඩව අභියෝගයන්ට මුහුණ දෙන ලදී. එක් වරක් පමණක් අයකරනු ලැබූ අධිභාර බද්ද හේතුවෙන් 2022 වසරේ දී ආදායම වැඩි වුව ද, අනම්‍යශීලී හා වෙනස් කිරීමට අසීරු පුනරාවර්තන වියදම් අඛණ්ඩව සැලකියයුතු ලෙස ආදායම ඉක්මවා යන ලදී. ඒ අනුව, අයවැය හිඟය 2021 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ රු. බිලියන 520.5 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 524.1 ක් දක්වා ඉහළ ගියේය. විදේශීය මූල්‍ය ප්‍රභවයන්ට ඇති ප්‍රවේශය සීමා සහිත වීම හේතුවෙන් අයවැය හිඟය මූල්‍යයනය කිරීම අභියෝගාත්මක වූ අතර, එබැවින් අයවැය හිඟය පියවීම සඳහා මුදල් මූල්‍යයනය අවශ්‍ය වීම, උද්ධමනකාරී පීඩනයන්ට මෙන්ම ගෙවුම් ශේෂ අවදානම් ඇති කිරීමට දායක විය.

බදු හා බදු නොවන ආදායම ඉහළ යැමේ ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේ පළමු මාස හතර තුළ දැක්වූ අඩු ආදායම් කාර්යසාධනයට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සමස්ත රාජ්‍ය ආදායමෙහි කාර්යසාධනය ඉහළ යන ලදී. ප්‍රදාන ද ඇතුළුව සමස්ත රාජ්‍ය ආදායම 2021 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 482.3 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 631.1 දක්වා සියයට 30.9 කින් වැඩිවූ අතර, එය වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 2,223.0 න් සියයට 28.4 ක ලඟා කර ගැනීමකි. 2022 වසරේ අප්‍රේල් මාසයේ දී, එක්වරක් පමණක් අයකරනු ලබන අධිභාර බද්දේ පළමු වාරිකය මගින් ලද රු. බිලියන 59.6 ක ආදායම පිළිබිඹු කරමින්, 2021 වසරේ පළමු මාස හතර තුළ ලැබුණු බදු ආදායම රු. බිලියන 427.3 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 543.6 ක් දක්වා සියයට 27.2 කින් වැඩි විය. 2022 වසරේ පළමු මාස හතර තුළ ලැබුණු බදු ආදායම වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව වන රු. බිලියන 1,987.0 න් සියයට 27.4 ක ලඟා කර ගැනීමකි. මේ ආකාරයෙන්ම, මහ බැංකු ලාභාංශ පැවරුම්හි වැඩි වීම පිළිබිඹු කරමින් බදු නොවන ආදායම ද 2021 වසරේ පළමු මාස හතර තුළ ලැබුණු රු. බිලියන 54.5 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 87.3 ක් දක්වා සියයට 60.2 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, එය වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 226.0 න් සියයට 38.6 ක ලඟා කර ගැනීමකි.

ආදායම් බදු, භාණ්ඩ හා සේවා මත බදු, නිෂ්පාදන/ සුරාබදු, වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු හා සෙස් බදු මගින් ලැබුණු බදු ආදායම හේතුවෙන් 2022 වසරේ පළමු මාස හතර තුළ කාර්යසාධනයේ වර්ධනයක් පිළිබිඹු විය. 2021 වසරේ පළමු මාස හතර තුළ ආදායම් බදු ආදායම රු. බිලියන 55.2 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 149.2 දක්වා සියයට 170.0 කින් වැඩි විය. 2022 වසරේ පළමු මාස හතර තුළ දී ආදායම් බදු ආදායම, වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 496.0 න් සියයට 30.1 ක් ලඟා කර ගෙන ඇත. 2021 වසරේ පළමු මාස හතර තුළ දේශීය පරිභෝජනය පාදක කරගත් බදු ආදායම රු. බිලියන 145.3 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 180.1 දක්වා සියයට 23.9 කින් වැඩි විය. දේශීය ක්‍රියාකාරකම් මගින් ලද එකතු කළ අගය මත බද්ද රු. බිලියන 62.4 සිට 2022 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 85.3 දක්වා සියයට 36.6 කින් වැඩි වූ අතර, දේශීය ක්‍රියාකාරකම් මගින් ලද නිෂ්පාදන/ සුරාබද්ද 2022 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 94.7 දක්වා සියයට 14.6 කින් වැඩි විය.

ආනයන ආශ්‍රිත ක්‍රියාකාරකම් මගින් ලද එකතු කළ අගය මත බද්ද, සෙස් බද්ද හා වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද ආදී ආනයන පාදක බදු මගින් ලද ආදායම 2021 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 200.7 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 203.6 ක් දක්වා සියයට 1.4 කින් ඉහළ යන ලදී. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් ආනයන සීමා පැනවීම හා විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාත අඩු කිරීම හේතුවෙන් රේගු ආනයන බද්ද හා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මගින් එකතු වූ ආදායම පිළිවෙළින් රු. බිලියන 17.5 දක්වා සියයට 44.7 කින් ද, රු. බිලියන 15.8 දක්වා සියයට 22.9 කින් ද අඩු විය. ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන ප්‍රමාණය 2021 වසරේ පළමු මාස හතර තුළ මෙ.ටො. මිලියන 3.4 සිට 2022 වසරේ එම කාලසීමාව සඳහා මෙ.ටො. මිලියන 2.9 ක් දක්වා පහත වැටීම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදන මත නිෂ්පාදන බදු ආදායම 2021 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 20.7 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 16.4 ක් දක්වා සියයට 20.4 කින් කැපී පෙනෙන ලෙස අඩු විය.

2021 වසරේ පළමු මාස හතර තුළ සමස්ත රාජ්‍ය වියදම රු. බිලියන 1,002.8 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 1,155.2 දක්වා සියයට 15.2 කින් වැඩි විය. එය, රු. බිලියන 1,016.8 ක් වූ පුනරාවර්තන වියදම්වලින් හා රු. බිලියන 138.4 ක් වූ ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය ලබා දීම් වලින් සමන්විත විය. සමෘද්ධිලාභීන් හා අනෙකුත් සහනාධාරලාභීන් සඳහා අතිරේක ජීවනෝපාය ආධාර ලබාදීම හා රාජ්‍ය සේවකයින් හා විශ්‍රාමිකයින් සඳහා රු. 5,000 බැගින් අතිරේක ගෙවීමක් සිදු කිරීම, පොළී ගෙවීම්, සහනාධාර හා පැවරුම්, වැටුප් හා විශ්‍රාම වැටුප් හේතුවෙන් 2021 වසරේ පළමු මාස හතර තුළ පුනරාවර්තන වියදම් රු. බිලියන 890.1 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 1,016.8 දක්වා සියයට 14.2 කින් වැඩි විය.

2022 වසරේ පළමු මාස හතර තුළ රජයේ වියදම සියයට 83.0 කින් ආදායම ඉක්මවා යමින් රු. බිලියන 524.1 ක් වූ අයවැය හිඟයක් ඇති කළ අතර, එය 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වූ රු. බිලියන 520.5 ක අයවැය හිඟයට සාපේක්ෂව 0.7 ක වැඩි වීමකි.

**වගුව 2.1:** 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා අයවැය සාරාංශය

රු. මිලියන

| අයිතමය | 2021 | 2022 (තාවකාලික) |
|---|---|---|
| ආදායම් හා ප්‍රදාන | **482,289** | **631,129** |
| ආදායම | **481,722** | **630,908** |
| බදු ආදායම | 427,261 | 543,649 |
| බදු නොවන ආදායම | 54,461 | 87,259 |
| ප්‍රදාන | 567 | 221 |
| වියදම | **1,002,832** | **1,155,229** |
| පුනරාවර්තන | 890,085 | 1,016,810 |
| පොළී ගෙවීම් | 366,240 | 426,786 |
| අනෙකුත් | 523,844 | 590,023 |
| රාජ්‍ය ආයෝජන | 114,227 | 140,999 |
| අනෙකුත් | -1,480 | -2,580 |
| ආදායම් අතිරික්තය (+)/ හිඟය (-) | **-408,362** | **-385,902** |
| සමස්ත අයවැය අතිරික්තය(+)/හිඟය (-) | **-520,543** | **-524,100** |
| මූල්‍යනය | **520,543** | **524,100** |
| විදේශීය මූල්‍යනය | **16,994** | **-126,985** |
| ණය ගැනීම් | 127,077 | 111,742 |
| ණය ආපසු ගෙවීම් | -110,083 | -238,727 |
| දේශීය මූල්‍යනය | **503,549** | **651,085** |
| ණය ගැනීම් | 1,397,680 | 3,564,527 |
| ණය ආපසු ගෙවීම් | -894,131 | -2,913,443 |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**වගුව 2.2:** 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම

රු. බිලියන

| අයිතමය | ඇස්තමේන්තුගත (වාර්ෂික) | තත්‍ය (ජන.-අප්‍රේ.) (තාවකාලික) | සාධනය (%) |
|---|---|---|---|
| මුළු ආදායම | **2,213** | **631** | **28.5** |
| බදු ආදායම | 1,987 | 544 | 27.4 |
| බදු නොවන ආදායම | 226 | 87 | 38.6 |
| මුළු වියදම | **3,851** | **1,155** | **30.0** |
| වර්තන වියදම | 2,935 | 1,017 | 34.6 |
| ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණයදීම් | 916 | 138 | 15.1 |

මූලාශ්‍ර : ජාතික අයවැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

පුළුල් වෙමින් පවතින අයවැය හිඟය සැලකිල්ලට ගනිමින්, තවදුරටත් එය ඉහළ යාම වළක්වාලීම සඳහා ඍජු මෙන්ම වක්‍ර බදුවලින් ලැබෙන ආදායම වැඩි කිරීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට රජය කටයුතු කර ඇත. 2022 වසරේ මැයි මස 31 වන දින, එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 8 සිට සියයට 12 දක්වා වැඩි කිරීමට ද, විදුලි සංදේශ බදු අනුපාතය සියයට 11.25 සිට සියයට 15 දක්වා වහාම වැඩි කරන ලදී. එමෙන්ම, එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව රු. මිලියන 300 සිට රු. මිලියන 120 දක්වා අඩු කිරීම, පදිංචියට යෝග්‍ය සහාධිපත්‍ය තට්ටු නිවාස විකිණීම සම්බන්ධයෙන් ලබා දී තිබූ එකතු කළ අගය මත බදු නිදහස් කිරීම ඉවත් කිරීම සහ 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම මගින් ඔට්ටු ඇල්ලීම හා සූදු බද්දෙන් ලැබෙන ආදායම වර්ධනය කරන අතරතුර, පුද්ගල ආදායම් බදු සහනය රු. මිලියන 3 සිට රු. මිලියන 1.8 දක්වා අඩු කිරීම, බදු අය කළ හැකි ආදායම මත බදු කාණ්ඩ (tax slabs) රු. මිලියන 3 සිට රු. මිලියන 1.2 දක්වා අඩු කිරීම සහ එක් එක් බදු කාණ්ඩයට සියයට 4-32 දක්වා බදු අනුපාත පැනවීම, සේවා නියුක්ති ආදායම මත රඳවා තබා ගැනීමේ බදු අනිවාර්යය කිරීම ඇතුළු බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත. මේ අතරතුර, වාහන මිලදී ගැනීම, නව ගොඩනැගිලි ඉදිකිරීම, ගොඩනැගිලිවල හදිසි නොවන අලුත්වැඩියා කටයුතු තාවකාලිකව නතර කිරීම, හදිසි නොවන ව්‍යාපෘති සහ ප්‍රාග්ධන වියදම් කල් දැමීම, අතිකාල දීමනා ගෙවීම සහ අනෙකුත් වෙනස්කළ නොහැකි පුනරාවර්තන වියදම් තාර්කීකරණය ඇතුළු වියදම් තාර්කීකරණය සඳහා වන ක්‍රියාමාර්ග අඛණ්ඩව ගනු ලැබේ.

සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය හේතුවෙන් රාජ්‍ය මුදල් තත්ත්වය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය නිකුත් කරන ලදී. මෙමඟින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මූලික අදියරේ පවතින භාණ්ඩ සහ ඉදිකිරීම් ප්‍රසම්පාදනයත්, ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත් සමාලෝචනය කර තාවකාලිකව නතර කරන ලෙස වැය දරන ආයතන වෙතින් ඉල්ලීම් කර ඇත. බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවන අතරතුර, විවිධ භාණ්ඩ, ද්‍රව්‍ය හා උපකරණ බෙදා හැරීම යනාදිය ඇතුලත්වන අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම තාවකාලිකව නවතා දැමීමට ද මෙමඟින් වැඩි අවධානයක් යොමු කර ඇත.

## රාජ්‍ය ආදායම

ප්‍රදාන හැරුණු කොට සමස්ත රාජ්‍ය ආදායම, 2021 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ රු. බිලියන 481.7 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 630.9 දක්වා සියයට 31.0 කින් වැඩි විය.

ආදායම් බදුවලින් ලද ආදායම සියයට 170.0 කින් ද, එකතු කළ අගය මත බදු ආදායම සියයට 33.7 කින් ද, වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බදු ආදායම සියයට 16.4 කින් ද, සිගරට් මත නිෂ්පාදන බදු ආදායම සියයට 19.4 කින් ද, සුරාබදු ආදායම සියයට 13.5 කින් ද යන වශයෙන් සැළකිය යුතු ලෙස වැඩි වීම හේතුවෙන්, බදු ආදායම 2021 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ රු. බිලියන 427.3 ට සාපේක්ෂව, 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 543.6 ක් දක්වා සියයට 27.2 කින් වැඩි විය. මහ බැංකු ලාභ පැවරීම්වලින් ලද ආදායම සියයට 99.8 කින්, කුලී ආදායම සියයට 56.9 කින්, ලාභ හා ලාභාංශ ආදායම සියයට 61.8 කින් සහ දඩ, විකුණුම් හා ගාස්තුවලින් ලද ආදායම සියයට 83.1 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වීමත් සමඟ බදු නොවන ආදායම ද, 2021 වසරේ පළමු මාස හතර තුළ දී වාර්තා කළ රු. බිලියන 54.5 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 87.3 ක් දක්වා සියයට 60.2 ක වර්ධනයක් සනිටුහන් කරන ලදී.

**වගුව 2.3: 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා ඇස්තමේන්තුගත සහ තත්‍ය බදු ආදායම**

රු. මිලියන

| අයිතමය | වාර්ෂික ඇස්තමේන්තුව | තත්‍ය (ජන. - අප්‍රේ.) (තාවකාලික) |
|---|---|---|
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව** | | |
| ආදායම් සහ ලාභ මත බදු | 496,000 | 149,163 |
| එකතු කළ අගය මත බදු - දේශීය | 264,000 | 85,314 |
| ජාතිය ගොඩනැගීමේ බදු - දේශීය | - | 50 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - වෙනත් | 147,807 | 3,359 |
| **උප එකතුව** | **907,807** | **237,887** |
| **රේගු දෙපාර්තමේන්තුව** | | |
| ආනයන බදු | 115,000 | 17,505 |
| එකතු කළ අගය මත බදු - ආනයන | 160,000 | 50,832 |
| ජාතිය ගොඩනැගීමේ බදු - ආනයන | - | 9 |
| වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු | 175,000 | 62,633 |
| සෙස් ආනයන / අපනයන | 90,000 | 29,235 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 80,000 | 15,797 |
| ආර්ථික සේවා ගාස්තු | - | 26 |
| නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු | 250,000 | 62,824 |
| දුම්වැටි | 120,000 | 32,962 |
| ඛනිජ තෙල් | 75,000 | 16,446 |
| මෝටර් වාහන සහ අනෙකුත් | 55,000 | 13,416 |
| අනෙකුත් | 700 | 83 |
| **උප එකතුව** | **870,700** | **238,944** |
| **සුරා බදු දෙපාර්තමේන්තුව** | | |
| මත්පැන්/දුම්කොළ | 180,035 | 59,483 |
| **උප එකතුව** | **180,035** | **59,483** |
| **අනෙකුත්** | | |
| විදුලි සංදේශ බද්ද | 18,000 | 4,267 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 10,458 | 3,068 |
| **උප එකතුව** | **28,458** | **7,335** |
| **මුළු බදු ආදායම** | **1,987,000** | **543,649** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව


**වගුව 2.4: 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය**

රු. මිලියන

| අයිතමය | 2021 | 2022 (තාවකාලික) | වර්ධනය (%) |
|---|---|---|---|
| **බදු ආදායම** | **427,261** | **543,649** | **27.2** |
| ආදායම් බදු | 55,245 | 149,163 | 170.0 |
| දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු | 145,305 | 180,091 | 23.9 |
| එකතු කළ අගය මත බදු | 62,435 | 85,314 | 36.6 |
| නිෂ්පාදන බදු/සුරාබදු | 82,679 | 94,726 | 14.6 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 191 | 50 | -73.6 |
| ආනයන මත පදනම් වූ බදු | 200,710 | 203,582 | 1.4 |
| රේගු බදු | 31,644 | 17,505 | -44.7 |
| එකතු කළ අගය මත බදු | 39,407 | 50,832 | 29.0 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 5 | 9 | 78.7 |
| වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු | 53,814 | 62,633 | 16.4 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 20,500 | 15,797 | -22.9 |
| නිෂ්පාදන බදු | 28,574 | 27,571 | -3.5 |
| සෙස් | 26,766 | 29,235 | 9.2 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 26,000 | 10,813 | -58.4 |
| **බදු නොවන ආදායම** | **54,461** | **87,259** | **60.2** |
| **මුළු ආදායම** | **481,722** | **630,908** | **31.0** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**රූප සටහන 2.1: 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා රජයේ ආදායම් සංයුතිය**




මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## බදු ආදායම

සමස්ත ආදායමෙන් සියයට 86.2 ක් වූ බදු ආදායම, 2021 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ රු. බිලියන 427.3 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රු. බිලියන 543.6 ක් දක්වා සියයට 27.2 කින් වැඩි විය. සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන බදු ආදායම සියයට 53.7 කින් සැලකිය යුතු ලෙස ඉහළ යාම සහ අධිභාර බද්ද හඳුන්වා දීම හේතුවෙන් ආදායම් බද්දෙන් ලද ආදායම රු. බිලියන 55.2 සිට රු. බිලියන 149.2 ක් දක්වා සියයට 170.0 කින් වර්ධනය විය. සමස්ත බදු ආදායමට ආදායම් බද්දෙන් ලැබෙන දායකත්වය 2021 වසරේ පළමු මාස හතර තුළ වාර්තා වූ සියයට 12.9 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාල පරිච්ඡේදයේ සියයට 27.4 ක් දක්වා ඉහළ ගොස් තිබේ. අධිභාර බද්දෙහි දායකත්වය හේතුවෙන්, බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස වක්‍ර බදුවලින් ලද ආදායම, 2021 වසරේ ජනවාරි-අප්‍රේල් කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ සියයට 87.1 සිට, 2022 වසරේ ජනවාරි-අප්‍රේල් කාලපරිච්ඡේදය තුළ සියයට 72.6 ක් දක්වා අඩු විය.

## ආදායම් බද්ද

ආදායම් බදු ආදායම, 2021 වසරේ පළමු මාස හතරක කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 55.2 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 149.2 ක් දක්වා සියයට 170.0 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. මෙම වර්ධනය, රු. බිලියන 47.0 ක සිට රු. බිලියන 72.2 ක් දක්වා සියයට 53.7 කින් සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන බදු ආදායම වැඩි වීම මගින් සනිටුහන් විය. ඊට අමතරව, 2020/2021 තක්සේරු වර්ෂය තුළ රු. මිලියන 2,000 ක් ඉක්මවන ලද බදු අය කළ හැකි ආදායමක් හිමි ඕනෑම පුද්ගලයෙකුගෙන්, හවුල් ව්‍යාපාරයකින් සහ සමාගමකින් අය කරනු ලබන අධිභාර බද්දෙහි පළමු වාරිකය ලෙස රු. බිලියන 59.6 ක ආදායමක් ලැබිණි. මෙහි දෙවන සහ අවසාන වාරිකය 2022 ජූලි මස 20 වන දින ලැබෙනු ඇත. ඊට අමතරව, උපයන විට ගෙවීමේ බද්ද/අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් ලද ආදායම රු. බිලියන 4.4 සිට රු. බිලියන 7.2 දක්වා සියයට 63.3 කින් වර්ධනය වූ අතර, පොළී මත බදු ආදායම ද රු. බිලියන 3.3 සිට රු. බිලියන 5.6 දක්වා සියයට 70.4 ක වර්ධනයක් සනිටුහන් කරන ලදී. ප්‍රාග්ධන ලාභ බද්ද මගින් ලද ආදායම ද රු. මිලියන 191 සිට රු. මිලියන 633 ක් දක්වා සියයට 230.6 කින් වැඩි විය. තවද, මීට පෙර හෙළිදරව් නොකර පැවති ආදායම් සහ වත්කම් හෙළිදරව් කරන ලද සහ 2021 අංක 18 දරන මුදල් පනතේ දක්වා ඇති ක්‍රමවේදයන්ට අනුව

ආයෝජනය කරන ලද පුද්ගලයන් මත ක්ෂමා බද්දක් ලෙස අය කරන ලද ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද මගින් 2022 මාර්තු මස අවසානය වන විට රු. මිලියන 3,887 ක ආදායමක් වාර්තා විය.

**වගුව 2.5:** 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා ආදායම් බදු කාර්යසාධනය

රු. මිලියන

| බදු පදනම | 2021 | 2022 (තාවකාලික) | වර්ධනය (%) |
|---|---|---|---|
| සංස්ථාපිත හා සංස්ථාපිත නොවන | 46,967 | 72,184 | 53.7 |
| උපයන විට ගෙවීම් | 4,396 | 7,177 | 63.3 |
| පොළී ආදායම මත බදු | 3,268 | 5,569 | 70.4 |
| ආර්ථික සේවා ගාස්තු | 423 | 127 | -70.0 |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 191 | 633 | 230.6 |
| අධිභාර බද්ද | - | 59,586 | - |
| ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | - | 3,887 | - |
| එකතුව | **55,245** | **149,163** | **170.0** |

## එකතු කළ අගය මත බද්ද (VAT)

2022 වසර සඳහා ඇස්තමේන්තු කළ ආදායමෙන් සියයට 32.1 ක් රැස් කර ගනිමින් එකතු කළ අගය මත බදු ආදායම 2021 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 101.8 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 136.1 ක් දක්වා සියයට 33.7 කින් වැඩි විය. 2022 වසරේ පළමු මාස හතර තුළ දී දේශීය ක්‍රියාකාරකම්වලින් ලද එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 85.3 ක් දක්වා සියයට 36.6 කින් ද ආනයනවලින් ලද එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 50.8 ක් දක්වා සියයට 29.0 කින් ද වැඩි විය. එකතු කළ අගය මත බදු ආදායම වැඩිවීමට 2022 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීම, ගෝලීය වශයෙන් භාණ්ඩවල මිල ඉහළ යාම සහ ලෝකයේ සියළුම ප්‍රධාන මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම යනාදිය හේතු විය.

**වගුව 2.6:** 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා එකතු කළ අගය මත බදු ආදායමේ කාර්යසාධනය

රු. මිලියන

| බදු පදනම | 2021 | 2022 (තාවකාලික) | වර්ධනය (%) |
|---|---|---|---|
| දළ ආදායම | **101,842** | **136,281** | **33.8** |
| දේශීය | 62,435 | 85,341 | 36.7 |
| ආනයන | 39,407 | 50,940 | 29.3 |
| ආපසු ගෙවුම් | - | 134 | - |
| ශුද්ධ ආදායම | **101,842** | **136,147** | **33.7** |
| ආපසු ගෙවුම් දළ ආදායමේ % ලෙස | **-** | **0.1** | **-** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## නිෂ්පාදන/ සුරා බද්ද

ඛනිජ තෙල් සහ නිෂ්පාදන බදු අයකල හැකි අනෙකුත් අයිතම වලින් ලැබෙන ආදායම පහත වැටුණ ද, ප්‍රධාන වශයෙන් මද්‍යසාර, සිගරට් සහ මෝටර් වාහනවලින් ලැබෙන ආදායම වැඩිවීම නිසා 2022 වසරේ පළමු මාස හතර තුළ දී නිෂ්පාදන බදු තුළින් ලද ආදායම 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ලද රු. බිලියන 111.3 ට සාපේක්ෂව රු. බිලියන 122.3 ක් දක්වා සියයට 9.9 කින් ඉහළ යන ලදී. නිෂ්පාදන/සුරා බදු ආදායම, 2022 වසරේ පළමු මාස හතර තුළ දී සමස්ත බදු ආදායමෙන් සියයට 22.5 කට සහ සමස්ත ආදායමෙන් සියයට 19.4 කට දායක වී ඇති අතර එය රු. බිලියන 430.0 ක වාර්ෂික ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 28.4 ක් ලඟා කර ගැනීමකි.

ප්‍රධාන වශයෙන්ම 2021 නොවැම්බර් මස 12 වන දින සිට ඉහළ නංවන ලද මත්පැන් මත වූ සුරාබද්ද සමඟ 2022 ජනවාරි මස 3 වන දින සිට ආරක්ෂිත සලකුණු සහ ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් මත්පැන් මත වූ සුරාබද්දෙන් ලද ආදායම, 2021 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 52.4 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 59.5 දක්වා සියයට 13.5 කින් සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී.

සිගරට් තුළින් ලද නිෂ්පාදන බදු ආදායම 2022 වසරේ ජනවාරි සිට අප්‍රේල් දකවා කාලය සඳහා රු. බිලියන 33 ක් වූ අතර එය 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයක දී වූ රු. බිලියන 27.6 ට සාපේක්ෂව සියයට 19.4 ක කැපී පෙනෙන ලෙස වැඩිවීමකි. 2022 අයවැය තුළින් සිගරට් සඳහා බදු අනුපාත ඉහළ දැමීම සමඟින් ඉහත සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ විශේෂයෙන්ම දිග මිලි මීටර 67 ට අඩු සිගරට්වල ඉහළ අලෙවිය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය.

2020 මාර්තු මාසයේ සිට අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කිරීමට ක්‍රියාමාර්ග හඳුන්වා දුන්න ද 2022 පළමු මාස හතර තුළ දී මෝටර් වාහන මත නිෂ්පාදන බදු තුළින් ජනිත කරන ලද ආදායම 2021 වසරේ සමාන කාලයකදී වූ රු. බිලියන 7.9 ට සාපේක්ෂව රු. බිලියන 11.1 ක් දක්වා සියයට 40.4 කින් වැඩි විය.

ඛනිජ තෙල් නිෂ්පාදන තුළින් 2022 පළමු මාස හතර සඳහා ලද ආදායම 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ලද රු. බිලියන 20.7 ට සාපේක්ෂව රු. බිලියන 16.4 ක් දක්වා සියයට 20.4 කින් අඩු වූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ මෙම කාලපරිච්ඡේදය තුළ දී ඩීසල් ආනයනය අඩු වීමයි. කෙසේවුවද, 2022 පළමු මාස හතර තුළ දී අනෙකුත් නිෂ්පාදන බද්දට යටත් අයිතම තුළින් ලද ආදායම 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ලද රු. බිලියන 2.7 ට සාපේක්ෂව රු. බිලියන 2.3 ක් දක්වා සියයට 14.0 කින් අඩු විය.


**වගුව 2.7: 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා නිෂ්පාදන බදු/සුරාබදු ආදායම් කාර්යසාධනය**

රු. මිලියන

| බදු පදනම | 2021 | 2022 (තාවකාලික) | වර්ධනය (%) |
|---|---|---|---|
| මත්පැන් | 52,412 | 59,473 | 13.5 |
| දුම්වැටි හා දුම්කොළ | 27,602 | 32,962 | 19.4 |
| මෝටර් වාහන | 7,921 | 11,125 | 40.4 |
| ඛනිජ තෙල් | 20,653 | 16,446 | -20.4 |
| අනෙකුත් | 2,665 | 2,291 | -14.0 |
| **එකතුව** | **111,253** | **122,297** | **9.9** |

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**රූප සටහන 2.2: 2021 සහ 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා නිෂ්පාදන/සුරා බදු කාර්යසාධනය**




මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## වෙනත් බදු

වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් සහ සෙස් බද්දෙන් උපයාගත් ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ මධ්‍යස්ථව වැඩි විය. කෙසේ වෙතත්, රේගු ආනයන බද්ද, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (SCL) සහ විදුලි සංදේශ බද්දෙන් එකතු වූ ආදායම 2021 වසරේ පළමු මාස හතර තුළ 2022 සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඩු විය.

ප්‍රධාන වශයෙන් ගෝලීය ඛනිජ තෙල් මිල ඉහළ යාම හේතුවෙන් වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් ලද ආදායම 2022 වසරේ පළමු මාස හතර තුළ සියයට 16.4 කින් රු. බිලියන 53.8 සිට රු. බිලියන 62.6 ක් දක්වා වැඩිවිය. තවද මෙය 2022 වර්ෂය සඳහා වූ රු. බිලියන 175.0 ක් වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 35.8 ක ළඟා කර ගැනීමකි. ගෝලීය වෙළෙඳපොළේ භාණ්ඩ මිල ඉහළ යාමෙන් සහ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීමෙන් වූ බලපෑම් මෙන්ම 2021 අයවැය සමඟ ආනයන සෙස් බදු අනුපාත ඉහළ නැංවීම ද යන කරුණු හේතුවෙන් සෙස් බද්දෙන් ලද ආදායම 2021 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 26.8 ට සාපේක්ෂව 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 29.2 ක් දක්වා සියයට 9.2 කින් වර්ධනය විය. 2022 වසරේ පළමු මාස හතර තුළ දී ලද සෙස් බදු ආදායම, 2022 වසර සඳහා වාර්ෂික ඇස්තමේන්තුගත ආදායම වන රු. බිලියන 90.0 න් සියයට 32.5 ක ළඟා කර ගැනීමකි. පෝට්ලන්ඩ් සිමෙන්ති, බීඩි කොළ, ලිහිසි තෙල් සහ වියන ලද රෙදි ආනයනයෙන් උපයාගත් ඉහළ ආදායමත් සමඟ ආනයන මත සෙස් බද්දෙන් ලද ආදායම, 2021 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 26.1 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 28.5 දක්වා සියයට 9.5 කින් ඉහළ යන ලදී. අපනයන මත සෙස් බද්දෙන් ලද ආදායම 2021 වසරේ පළමු මාස හතර තුළ දී වූ රු. බිලියන 0.71 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 0.69 දක්වා සියයට 1.5 කින් සුළු වශයෙන් පහළ යන ලදී. තේ, පොල්, ඉල්මනයිට් සහ පේල් ක්‍රේප් රබර් අපනයනයන් 2022 වසරේ පළමු මාස හතර තුළ අපනයන මත සෙස් බදු ආදායමට ඉහළම දායකත්වයක් ලබා දෙන ලදී.

මේ අතර, රේගු ආනයන බද්දෙන් ලද ආදායම 2022 පළමු මාස හතර තුළ රු. බිලියන 17.5 ක් වූ අතර එය 2021 සමාන කාල පරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 31.6 ට සාපේක්ෂව සියයට 44.7 ක සැලකිය යුතු අඩුවීමකි. එසේම, විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම සියයට 22.9 කින් රු. බිලියන 15.8 ක් දක්වා අඩු වූ අතර එයට අත්‍යාවශ්‍ය භාණ්ඩ සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාත පහළ දැමීම හේතු විය. 2022 වසරේ පළමු මාස හතර තුළ විදුලි සංදේශ බද්දෙන් එකතු වූ ආදායම රු. බිලියන 4.3 ක් දක්වා සියයට 1.6 කින් ආන්තිකව අඩු විය.

## බදු නොවන ආදායම

වසංගතයෙන් පසු ආර්ථික ක්‍රියාකාරකම්හි පුනර්ජීවනයත් සමඟ, බදු කුලී, රජය සතු ව්‍යවසායයන් මඟින් උපයන ලද ලාභ හා ලාභාංශ මෙන්ම විකුණුම් හා ගාස්තු ආදායම්හි වැඩි වීම හේතුවෙන් 2021 පළමු මාස හතර තුළ බදු නොවන ආදායම රු. බිලියන 54.5 සිට 2022 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 87.3 ක් දක්වා සියයට 60.2 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. එකතු කළ බදු නොවන ආදායම, 2022 වසර සඳහා වන රු. බිලියන 226.0 ක වාර්ෂික ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 38.6 ක ළඟා කර ගැනීමකි.

කුලී ආදායම, රජය සතු ව්‍යවසායයන් මඟින් උපයන ලද ලාභ හා ලාභාංශ, දඩ මුදල්, විකුණුම් හා ගාස්තු යනාදියෙන් එකතු කළ බදු නොවන ආදායම 2021 වසරේ පළමු මාස හතර තුළ පිළිවෙළින් රු. බිලියන 1.4, රු. බිලියන 7.0 හා රු. බිලියන 12.5 සිට 2022 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී පිළිවලින් රු. බිලියන 2.2, රු. බිලියන 11.4 සහ රු. බිලියන 22.9 දක්වා පිළිවෙළින් සියයට 56.9 කින්, සියයට 61.8 කින් සහ සියයට 83.1 කින් සැලකියයුතු ලෙස වර්ධනය විය. මහ බැංකු ලාභ පැවරුම්, සමාජ ආරක්ෂණ දායකත්වය හා වෙනත් බදු නොවන ආදායම් මඟින් ලද බදු නොවන ආදායම ද 2021 වසරේ පළමු මාස හතර තුළ පිළිවෙළින් රු. බිලියන 15.0, රු. බිලියන 11.3 හා රු. බිලියන 5.9 සිට 2022 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 30.0, රු. බිලියන 12.1 හා රු. බිලියන 7.5 දක්වා වර්ධනය විය. කෙසේවෙතත්, පොළී ආදායම 2021 වසරේ පළමු මාස හතර තුළ වූ රු. බිලියන 1.3 ට සාපේක්ෂව 2022 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 1.1 දක්වා සියයට 13.1 කින් ආන්තිකව පහත වැටී ඇත.

**වගුව 2.8: රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය**

රු. බිලියන

| අයිතමය | 2021 (ජන.-අප්‍රේ.) | 2022 (වාර්ෂික ඇස්තමේන්තුව) | 2022 (ජන.-අප්‍රේ.) | හේතුව |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 55.2 | 496.0 | 149.2 | 2022 පළමු මාස හතර තුළදී ආදායම් බදු තුළින් ලද ආදායම 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේදී වාර්තා වූ රු. බිලියන 55.2 ක සිට රු. බිලියන 149.2 ක් දක්වා සියයට 170.0 කින් කැපී පෙනෙන ලෙස වැඩි වූ අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 30.1ක ළඟාකර ගැනීමකි. සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු ආදායම රු. බිලියන 47.0 සිට රු. බිලියන 72.2 ක් දක්වා සියයට 53.7 කින් වැඩිවීමත් සමඟින් එක්වරක් පමණක් ගෙවන බද්දක් ලෙස හඳුන්වාදෙන ලද අධිභාර බද්දේ පළමු වාරිකය තුළින් ලද රු. බිලියන 59.6ක ආදායම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව, 2022 පළමු මාස හතර තුළදී 2021 සමාන කාලපරිච්ඡේදයකට සාපේක්ෂව උපයන විට ගෙවීමේ බද්ද/අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද රු. බිලියන 4.4 සිට රු. බිලියන 7.2 දක්වා සියයට 63.2 කින් වැඩිවූ අතර පොළී මත බද්ද රු. බිලියන 3.3 සිට රු. බිලියන 5.6 දක්වා සියයට 70.4 කින් වැඩි විය. සමාලෝචික කාලපරිච්ඡේදය තුළ ප්‍රාග්ධන ලාභ තුළින් ලද ආදායම රු. මිලියන 191 සිට මිලියන 633 දක්වා සියයට 230.6 කින් කැපීපෙනෙන ලෙස වැඩි වී ඇත. මීට අමතරව, හෙළිදරව් නොකරන ලද ආදායම හෙළිදරව් කරන ලද හෝ එවැනි ආයෝජන/ වත්කම් ආයෝජනය කරන ලද පුද්ගලයකු මත පොදු සමාව බද්දක් ලෙස අයකරන ලද ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද තුළින් රු. මිලියන 3,887 ක් වාර්තා විය. |
| එකතු කළ අගය මත බද්ද | 101.8 | 424.0 | 136.1 | 2022 වසරේ පළමු මාස හතර තුළ එකතු කළ අගය මත බදු ආදායම 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයෙහි වූ රු. බිලියන 101.8 ට සාපේක්ෂව රු. බිලියන 136.1 ක් දක්වා සියයට 33.7 කින් සැලකියයුතු ලෙස ඉහළ ගිය අතර එය 2022 වසරේ වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 32.1 ක ළඟාකර ගැනීමකි. දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ඉහළ භාණ්ඩ මිල ගණන් පෙන්නුම් කරමින් 2021 වසරේ මැයි මාසයේ වූ සියයට 4.5 සිට 2022 මැයි මාසයේ සියයට 39.1 දක්වා උද්ධමනය (ලක්ෂ්‍යමය කොළඹ පාරිභෝගික මිල දර්ශකය) ඉහළ යාම හා ආර්ථික කටයුතු වර්ධනය වීම මෙම ආදායම් කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2022 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීම හා සියලුම ප්‍රධාන ව්‍යවහාරික මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමද එකතු කළ අගය මත බදු ආදායමේ මෙම නාමික වර්ධනය සඳහා හේතු විය. |
| නිෂ්පාදන බදු | 111.3 | 430.0 | 122.3 | 2022 වසරේ පළමු මාස හතර තුළ නිෂ්පාදන බදු තුළින් ලද ආදායම 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වූ රු. බිලියන 111.3 ට සාපේක්ෂව රු. බිලියන 122.3 ක් දක්වා සියයට 9.9 කින් වර්ධනය වූ අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 28.4 ක ළඟා කර ගැනීමකි. මත්පැන්, සිගරට් සහ මෝටර් වාහන තුළින් ලද ආදායම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේවුවද ඛනිජතෙල් සහ අනෙකුත් නිෂ්පාදන බද්දට යටත් අයිතම තුළින් ලද ආදායම අඩු විය. 2022 පළමු මාස හතර සඳහා සුරාබදු ආදායම 2021 සමාන කාලපරිච්ඡේදයක වූ රු. බිලියන 52.4 ට සාපේක්ෂව රු. බිලියන 59.5 ක් දක්වා සියයට 13.5 කින් වර්ධනය වූ අතර මත්පැන් නිෂ්පාදන මත නිෂ්පාදන බදු ඉහළ දමමින් සංශෝධනය කිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. සිගරට් තුළින් ලද නිෂ්පාදන බදු ආදායම 2022 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය සඳහා රු. බිලියන 33 ක් වූ අතර එය 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයකදී වූ රු. බිලියන 27.6 ට සාපේක්ෂව සියයට 19.4 ක කැපී පෙනෙන ලෙස වැඩි වී ඇත. 2022 අයවැය තුළින් සිගරට් සඳහා බදු අනුපාත ඉහළ දැමීම සමඟින් ඉහත සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ විශේෂයෙන්ම දිග මිලි මීටර 67 ට අඩු සිගරට්වල ඉහළ අලෙවිය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. 2020 මාර්තු මාසයේ සිට අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කිරීමට ක්‍රියාමාර්ග හඳුන්වා දුන්නද 2022 පළමු මාස හතර තුළ දී මෝටර් වාහන මත නිෂ්පාදන බදු තුළින් ලද ආදායම 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයේදී වූ රු. බිලියන 7.9 ට සාපේක්ෂව රු. බිලියන 11.1 ක් දක්වා රු. බිලියන 3.2 කින් වැඩි විය. ඛනිජ තෙල් නිෂ්පාදන තුළින් 2022 පළමු මාස හතර සඳහා ලද ආදායම 2021 සමාන කාලයක් තුළ දී ලද රු. බිලියන 20.7 ට සාපේක්ෂව රු. බිලියන 16.4 ක් දක්වා සියයට 20.4 කින් අඩු වූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ මෙම කාලපරිච්ඡේදය තුළදී ඩීසල් ආනයනය අඩු වීමයි. කෙසේවුවද, 2022 පළමු මාස හතර තුළදී අනෙකුත් නිෂ්පාදන බද්දට යටත් අයිතම තුළින් ලද ආදායම 2021 පළමු මාස හතර තුළ දී ලද රු. බිලියන 2.7 ට සාපේක්ෂව රු. බිලියන 2.3 ක් දක්වා අඩු විය. |

| අයිතමය | 2021 (ජන.-අප්‍රේ.) | රු. බිලියන<br>2022 (වාර්ෂික ඇස්තමේන්තුව) | 2022 (ජන.-අප්‍රේ.) | හේතුව |
|---|---|---|---|---|
| ආනයන බදු | 31.6 | 115.0 | 17.5 | 2022 පළමු මාස හතර තුළදී ආනයන බදු තුළින් ලද ආදායම පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව රු. බිලියන 17.5 ක් දක්වා සියයට 44.7 කින් කැපී පෙනෙන ලෙස අඩු වූ අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 15.2 ක ළඟාකර ගැනීමකි. අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ කෙරෙහි ආනයන සීමා ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ආනයන බද්දට යටත් ආනයන අඩු වීම මේ සඳහා හේතු විය. |
| වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද (PAL) | 53.8 | 175.0 | 62.6 | ගෝලීය ඛනිජ තෙල් මිලගණන් වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2022 පළමු මාස හතර තුළදී වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බදු තුළින් ලද ආදායම පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදයක වූ රු. බිලියන 53.8 සිට රු. බිලියන 62.6 ක් දක්වා සියයට 16.4 කින් කැපී පෙනෙන ලෙස වැඩි විය. එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 35.8 ක ළඟාකර ගැනීමකි. |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද | 20.5 | 80.0 | 15.8 | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද තුළින් ලද ආදායම මෙම කාලපරිච්ඡේදය තුළදී වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 19.7 ක් පමණ එකතු කරමින් සියයට 22.9 කින් කැපීපෙනෙන ලෙස අඩු විය. දේශීය ඉල්ලුම හා සැපයුම තිරසාර මට්ටමක පවත්වා ගැනීම සඳහා තෝරාගත් පාරිභෝගික භාණ්ඩවල බදු අනුපාත අඩුවන ලෙස වෙනස් කිරීම මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. |
| වෙනත් බදු | 53.0 | 267.0 | 40.1 | අනෙකුත් බදු තුළින් එකතු කරන ලද ආදායම 2022 පළමු මාස හතර තුළ දී රු. බිලියන 40.1 ක් වූ අතර එය පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදයක වූ රු. බිලියන 53.0 ට සාපේක්ෂව සියයට 24.3 ක අඩුවීමක් වේ. මෙම ආදායම 2022 වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 14.9 ක් වේ. |
| බදු නොවන ආදායම | 54.5 | 226.0 | 87.3 | 2022 වසරේ පළමු මාස හතර තුළ බදු නොවන ආදායම 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 60.2 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 38.6 ක ළඟා කර ගැනීමකි. මේ සඳහා ප්‍රධාන වශයෙන් බදු, කුලී, රජය සතු ව්‍යාපාර තුළින් ලද ලාභ හා ලාභාංශ, සහ විකුණුම් හා ගාස්තු වැඩිවීම හේතු විය. බදු නොවන ආදායම වර්ධනය කර ගැනීම සඳහා රු. බිලියන 30 ක මහ බැංකු ලාභ ලැබීම කැපීපෙනෙන ලෙස දායක වී ඇත. |
| **එකතුව** | **481.7** | **2,213.0** | **630.9** | |

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලදී

**විශේෂ සටහන 2.1:** ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2022 ජනවාරි - ජුනි

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය) | |
| 2022.01.01 | සුරාබදු නිවේදන අංක 01/2022 (2022.01.01 දිනැති අංක 2260/78 දරන ගැසට් නිවේදනය)<br><br>-තරු 03 හා තරු 04 හෝටල් සහ තරු 05 හා ඊට ඉහළ ශ්‍රේණියේ හෝටල්/ බූටික් හෝටල්/ බූටික් විලා පෞරාණික වැදගත්කමක් ඇති හෝටල් සඳහා මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් අය කරනු ලබන ගාස්තුව 2022 මාර්තු 31 දින දක්වා ගෙවීමෙන් නිදහස් කිරීම |
| 2022.01.01 | සුරාබදු නිවේදන අංක 02/2022 (2022.01.01 දිනැති අංක 2260/79 දරන ගැසට් නිවේදනය)<br><br>-ර.බී.7, ර.බී.8, ර.බී.11, ර.බී.12 සහ ර.බී.22 බී බලපත්‍රලාභීන් සඳහා අය කරනු ලබන වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තුව 2022 මාර්තු 31 දින දක්වා ගෙවීමෙන් නිදහස් කිරීම |
| 2022.01.27 | 2022.01.27 දිනැති අංක 2264/28 හා අංක 2264/29 දරන ගැසට් නිවේදන<br><br>-නීතිමය අවශ්‍යතාවය පූර්ණ කිරීම උදෙසා සුරාබදු ආඥා පනතේ (52 වන අධිකාරය) 32 වන වගන්තිය යටතේ අංක 08/2021 හා අංක 09/2021 දරන සුරාබදු නිවේදන 2021 දෙසැම්බර් මස 10 වන දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බව දැනුම් දීම |
| 2022.04.29 | සුරාබදු නිවේදන අංක 03/2022 (2022.04.29 දිනැති අංක 2277/62 දරන ගැසට් නිවේදනය)<br><br>-ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලාභී යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ, ඉන් නිකුත් කරනු ලබන්නා වූ බෝතල් කරන ලද රා ලීටරයක් වෙනුවෙන් පනවනු ලබන බද්ද රු. 25/- සිට රු. 50/- දක්වා ඉහළ නැංවීම |
| 2022.06.08 | සුරාබදු නිවේදන අංක 04/2022 (2022.06.08 දිනැති අංක 2283/28 දරන ගැසට් නිවේදනය)<br><br>- දේශීයව සපයනු ලබන හා ආනයනය කරනු ලබන ඊතයිල් මධ්‍යසාර සඳහා සුරා බද්ද ඉහළ නැංවීම |
| 2002 අංක 13 දරන එකතු කළ අගය මත බදු පනත | |
| 2022.01.01 | - මූල්‍ය ආයතන විසින් සපයනු ලබන මූල්‍ය සේවා මත වන එකතු කළ අගය මත වන බද්ද 15% සිට 18 % දක්වා වැඩි කිරීම |
| 2022.06.01 | 2022.05.31 දිනැති අංක 2282/26 දරන ගැසට් නිවේදනය<br><br>- එකතු කළ අගය මත සාමාන්‍ය බදු අනුපාතය 8% සිට 12% දක්වා ඉහළ නැංවීම |
| 2022 අංක 14 දරන අධිභාර බදු පනත | |
| 2022.04.07 | - 2020/2021 තක්සේරු වර්ෂය සඳහා රු. මිලියන 2,000 කට වඩා බදු අය කළ හැකි ආදායමක් ලබන පුද්ගලයන්ගේ, හවුල් ව්‍යාපාරවල හෝ සමාගම් මත සියයට 25 ක අනුපාතය යටතේ එක් වරක් පමණක් අයකළ හැකි අධිභාර බද්දක් පැනවීම |
| වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු - 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත | |
| 2022.01.06 | 2022.01.06 දිනැති අංක 2261/58 දරන ගැසට් නිවේදනය<br><br>2020 ඔක්තෝම්බර් මස 26 දිනැති ගැසට් නිවේදන අංක 2199/2 සංශෝධනය කිරීම මඟින් රජයේ රෝහල් සහ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ප්‍රදානය කරනු ලැබූ වෛද්‍ය උපකරණ, යන්ත්‍රෝපකරණ ආදිය මත පනවා ඇති වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු නිදහස් කිරීම |
| 2022.01.12 | 2022.01.11 දිනැති අංක 2262/19 දරන ගැසට් නිවේදනය<br><br>අළුතින් නිර්මාණය කරන ලද ජාතික සංයෝජිත සංකේතාංක උපබෙදුම් සඳහා සහනදායී බදු අනුපාත සහ වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු නිදහස් කිරීම් නියම කිරීම |
| සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | |
| 2022.01.12 | 2022.01.11 දිනැති අංක 2262/20 දරන ගැසට් නිවේදනය<br><br>-සහල්, මත්ස්‍ය නිෂ්පාදන සහ ද්‍රව පෙට්‍රෝලියම් වායුව මාරු කිරීමට අදාළ උපාංග සඳහා නිර්මාණය කරන ලද නව ජාතික සංයෝජිත සංකේතාංක උප බෙදුම් සඳහා දැනට පවතින සෙස් බදු අනුපාත නියම කිරීම |
| 2022.03.11 | 2022.03.10 දිනැති අංක 2270/59 දරන ගැසට් නිවේදනය<br><br>-රෙදිපිළි සහ ඇඟලුම් සඳහා පවතින සෙස් බදු අනුපාත ඉහළ නැංවීම |
| 2022.05.19 | 2022.05.18 දිනැති අංක 2280/32 දරන ගැසට් නිවේදනය<br><br>-2022.01.11 දිනැති අංක 2262/20 දරන ගැසට් නිවේදනය නැවත ගැසට් කිරීම |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත | |
| 2022.01.12 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 01/2022 (2022.01.11 දිනැති අංක 2262/14 දරන ගැසට් නිවේදනය)<br><br>-ද්‍රවමය පෙට්‍රෝලියම් ගෑස් ආශ්‍රිත උපාංග වල ප්‍රමිතිය තක්සේරු කිරීම සහ අධීක්ෂණය කිරීම<br>-මත්ස්‍ය නිෂ්පාදන සඳහා වන ආනයන සහ වෙළඳපොල තොරතුරු අධීක්ෂණය කිරීම<br>-පටක රෝපණ පැළ වල අපනයන වර්ධනය සහ වෙළඳ පොළ තොරතුරු අධීක්ෂණය කිරීම<br>-දේශීය දුඹුරු සීනි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම<br>-බාස්මති සහ වෙනත් සහල් වර්ග පහසුවෙන් හඳුනා ගැනීම සඳහා වර්ගීකරණ ගැටළු නැතිකිරීම<br>යනාදිය සඳහා නව ජාතික උපබෙදුම් සංයෝජිත සංකේතාංක ඇතිකිරීම |
| 2022.03.10 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 02/2022 (2022.03.09 දිනැති අංක 2270/20 දරන ගැසට් නිවේදනය<br><br>-විදේශ මුදල් පිටතට ගල යාම අවම කිරීම සඳහා ආනයන අධෛර්යමත් කිරීමට, අත්‍යවශ්‍ය නොවන තෝරාගත් භාණ්ඩ කිහිපයක රේගු ආනයන බද්ද ඉහළ නැංවීම |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත | |
| 2022.01.01 | 2021.12.31 දිනැති අංක 2260/72 දරන ගැසට් නිවේදනය<br><br>-අර්තාපල් සහ බී ලූණු ආනයනය කිරීම මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කි.ග්‍රෑමයකට රු.30/-කින් මාස හයක කාලයක් සඳහා අඩු කිරීම |
| 2022.01.12 | 2022.01.11 දිනැති අංක 2262/15 දරන ගැසට් නිවේදනය<br><br>-සහල් සහ සීනි සඳහා නව සංයෝජිත සංකේතාංක නිර්මාණය කිරීම අනුව දැනට පවතින තීරුබදු අනුපාත මාස හයක කාලයක් සඳහා දීර්ඝ කිරීම |
| 2022.03.04 | 2022.03.03 දිනැති අංක 2269/48 දරන ගැසට් නිවේදනය<br><br>-කුඩා පරිමාණ සත්ව ආහාර නිෂ්පාදකයන්ගේ අමුද්‍රව්‍ය අවශ්‍යතා සහ කුකුළු නිෂ්පාදන මිල ගණන් සැලකිල්ලට ගනිමින් බඩඉරිඟු සඳහා කි.ග්‍රෑමයකට රු.10 ක සහනදායී තීරු බදු අනුපාතයක් හඳුන්වා දීම |
| 2022.03.04 | 2022.03.03 දිනැති අංක 2269/56 දරන ගැසට් නිවේදනය<br><br>-දේශීය ටින් මාළු කර්මාන්තය ආරක්ෂා කර ගැනීම, ගොවීන්ට හොඳ මිලක් සහතික කිරීම සහ පාරිභෝගිකයන් වෙනුවෙන් මිල ස්ථායිතාව පවත්වා ගැනීම සඳහා මැකරල් මාළු, උඳු, කව්පි, කුරක්කන් සහ මෙනේරි ආනයනය කිරීම මත පවතින තීරුබදු අනුපාත වලංගු කාලය වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම |
| 2022.03.10 | 2022.03.09 දිනැති අංක 2270/19 දරන ගැසට් නිවේදනය<br><br>-ආනයනය අඩු කිරීම සඳහා යෝගට් සහ බටර් ආනයනය මත කි.ග්‍රෑමයට රු. 1000 ක්, චීස් මත කි.ග්‍රෑමයකට රු. 400 ක්, රටඉඳි සහ නැවුම් දොඩම් මත කි.ග්‍රෑමයකට රු. 200 ක්, නැවුම් මිදි, ඇපල් සහ අනෙකුත් පළතුරු සඳහා කි.ග්‍රෑමයට රු.300 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙහි වලංගු කාලය මාස හයක කාලයක් සඳහා දීර්ඝ කිරීම |
| 2022.03.28 | 2022.03.28 දිනැති අංක 2273/01 දරන ගැසට් නිවේදනය<br><br>-රාමසාන් උත්සව සමය පිළිබඳ සලකා රට ඉඳි ආනයනය මත කි.ග්‍රෑමයට රු. 199/-ක තීරුබදු සහනය ලබාදීම |
| 2022.04.14 | 2022.04.13 දිනැති අංක 2275/02 දරන ගැසට් නිවේදනය<br><br>-පරිප්පු, මාළු, උම්බලකඩ, මුංඇට, මැංගුස් සහ කිවි ෆෲට් ආනයනය මත අදාල වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙහි වලංගු කාලය මාස හයක කාලයක් සඳහා දීර්ඝ කිරීම |
| ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසි | |
| 2022.01.12 | 2022 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2022.01.12 දිනැති අංක 2262/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br><br>-බාස්මතී සහල් ආනයන මත පනවා තිබූ තාවකාලික අත්හිටුවීම ඉවත් කිරීම<br>-කටු ගැලවූ මසුන් ආනයන මත පනවා තිබූ ආනයන සීමා නව සංයෝජිත සංකේතාංක අනුව අඛණ්ඩව පවත්වාගෙන යෑම |
| 2022.03.09 | 2022 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2022.03.09 දිනැති අංක 2270/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br><br>-තෝරාගත් භාණ්ඩ ආනයනය සඳහා ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවය පැනවීම |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2022.04.09 | 2022 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2022.04.09 දිනැති අංක 2274/42 දරන අති විශේෂ ගැසට් නිවේදනය)<br><br>-තෝරාගත් භාණ්ඩ ආනයනය සඳහා ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවය පැනවීම |
| 2003 අංක 25 දරන මුදල් පනත | |
| අපගමන බද්ද | |
| 2022.03.27 | 2022.03.27 දිනැති අංක 2272/53 දරන ගැසට් නිවේදනය<br><br>-කලාපීය ගමනාන්තයක් ලෙස සේවා සපයනු ලබන ජාත්‍යන්තර ගුවන් තොටුපළක් ලෙස ප්‍රචලිත කිරීමේ අරමුණු ඇතිව රත්මලාන කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළෙන් (CIAR) ශ්‍රී ලංකාවෙන් පිටවන ගුවන් මගීන් සඳහා අපගමන බද්ද සියයට 50 කින් ඇ.ඩො. 30 දක්වා අඩු කිරීම |
| 2022.04.29 | 2022.04.29 දිනැති අංක 2277/63 දරන ගැසට් නිවේදනය<br><br>-මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළෙන් (MRIA) නව ජාත්‍යන්තර ගුවන් සමාගම් විසින් මෙහෙයුම් ආරම්භ කළ දින සිට වසර දෙකක කාලයක් සඳහා අපගමන බදු සහනය ලබා දීම |
| 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත | |
| 2022.01.18 | 2022.01.18 දිනැති අංක 2263/03 දරන ගැසට් නිවේදනය<br><br>-HCL ටෙක්නොලොජීස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් අපනයනය සඳහා තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය මගින් බලගැන්වූ සේවාවන් සැපයීම පිණිසවූ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඊට අදාළ තොරතුරු සහ ලබාදෙන ලද නිදහස් කිරීම් ප්‍රකාශයට පත් කිරීම |

## රාජ්‍ය වියදම

2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ වියදම වන රු. බිලියන 1,002.8 හා සැසඳීමේ දී 2022 වසරේ පළමු මාස හතර තුළ රජයේ මුළු වියදම රු. බිලියන 1,155.2 ක් දක්වා සියයට 15.2 ක වැඩිවීමක් වාර්තා විය. 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 890.1 හා සැසඳීමේදී 2022 වසරේ පළමු මාස හතර සඳහා පුනරාවර්තන වියදම රු. බිලියන 1,016.8 දක්වා සියයට 14.2 කින් ඉහළ ගොස් ඇති අතර පොළී ගෙවීම, වැටුප් සහ විශ්‍රාම වැටුප් සඳහා වූ වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් එයට හේතු වී තිබේ. 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 112.7 හා සැසඳීමේදී 2022 වසරේ පළමු මාස හතර තුළ ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් සඳහා වියදම රු. බිලියන 138.4 දක්වා සියයට 22.8 කින් පමණ ඉහළ ගොස් ඇත.

**වගුව 2.9: 2022 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා රජයේ වියදම් කාර්යසාධනය**

රු.මිලියන

| අයිතමය | 2021 | 2022 (තාවකාලික) |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **890,085** | **1,016,810** |
| පුද්ගල පඩිනඩි | 274,044 | 316,051 |
| විශ්‍රාම වැටුප් | 87,345 | 99,659 |
| පොළී ගෙවීම්* | 366,240 | 426,786 |
| වෙනත් | 162,455 | 174,313 |
| **ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම්** | **112,748** | **138,419** |
| **එකතුව** | **1,002,832** | **1,155,229** |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
* දේශීය ණය සහ විදේශීය ණය සඳහා පොළී ගෙවීම සහ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම ඇතුළත් කර ඇත.

## පොළී ගෙවීම්

2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 366.2 හා සැසඳීමේ දී 2022 වසරේ පළමු මාස හතර තුළ දේශීය හා විදේශීය ණය ඇතුළත් ව පොළී ගෙවීම සඳහා මුළු වියදම රු. බිලියන 426.8 දක්වා සියයට 16.5 කින් පමණ ඉහළ ගොස් ඇත. 2021 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 92.4 හා සැසඳීමේ දී 2022 වසරේ පළමු මාස හතර තුළ විදේශ ණය සඳහා පොළී ගෙවීම් රු. බිලියන 84.9 දක්වා සියයට 8.1 කින් පමණ පහළ ගොස් ඇති අතර 2021 පළමු මාස හතර තුළදී රු. බිලියන 273.8 ක් වූ දේශීය ණය සඳහා පොළී ගෙවීම් 2022 වසරේ පළමු මාස හතර තුළ රු. බිලියන 341.9 දක්වා සියයට 24.8 කින් ඉහළ ඇත.

## වැටුප් හා වේතන සහ විශ්‍රාම වැටුප්

පළාත් සභා ඇතුළුව රාජ්‍ය සේවකයන්ගේ වැටුප් හා වේතන සඳහා 2022 වර්ෂයේ පළමු මාස හතරක කාලය තුළ දී රුපියල් බිලියන 316.1 ක වියදමක් දරා ඇති අතර 2021 වසරේ සමාන කාලසීමාව තුළ දරන ලද රු. බිලියන 274.0 ට සාපේක්ෂව එය සියයට 15.3 ක වර්ධනයකි. මෙයට අමතරව 2022 වසරේ පළමු මාස හතර තුළ විශ්‍රාම වැටුප් සඳහා රු. බිලියන 99.7 ක වියදමක් දරා ඇති අතර, එය 2021 වසරේ සමාන කාල සීමාව තුළ දරන ලද රු. බිලියන 87.3 ට සාපේක්ෂව සියයට 14.1 ක වර්ධනයකි. 2022 ජනවාරි මස සිට රාජ්‍ය සේවකයින්ට සහ විශ්‍රාමිකයන් සඳහා රුපියල් 5,000/- මාසික දීමනාව ලබා දීම මෙම වැඩි වීමට දායක වී ඇත.

## සුබසාධන වියදම්

2022 වර්ෂයේ පළමු මාස හතර තුළ "සමෘද්ධි" ගෙවීම්, වැඩිහිටි දීමනාව, ආබාධිත සෙබළුන් සඳහා ආධාර, ගැබිනි මව්වරුන් සඳහා ලබා දෙන ලද ආහාර පැකේජය, පොහොර සහනාධාරය සහ පාසල් නිල ඇඳුම් සහ පෙළ පොත් ඇතුළු ගෘහස්ථ සහනාධාර සඳහා රජය විසින් රු. බිලියන 191.2 ක මුදලක් දරන ලදී.

සමෘද්ධි දීමනාව මසකට රු.1,000 කින් වැඩි කිරීමට රජය විසින් ගන්නා ලද තීරණය හේතුවෙන් 2022 වර්ෂයේ පළමු මාස හතර සඳහා අඩු ආදායම්ලාභී පවුල් වලට ලබා දුන් සමෘද්ධි මුදල් ප්‍රදානය සඳහා වූ වියදම 2021 වර්ෂයේ එම කාලපරිච්ඡේදය තුළ පැවති රු. මිලියන 17,271 සිට රු. මිලියන 20,679 දක්වා වැඩි වී ඇත.

රජයේ රෝහල්වල වෛද්‍ය සැපයුම් ද ඇතුළුව සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන සඳහා 2022 වසරේ මුල් මාස හතර තුළ රජයේ වියදම 2021 වසරේ එම කාලය සඳහා වූ රු. මිලියන 20,143 ට සාපේක්ෂව රු. මිලියන 19,655 ක් දක්වා සියයට 30.8 කින් පහළ ගොස් ඇත. මෙම පහත වැටීමට හේතු වී ඇත්තේ, ගැබිනි මව්වරුන් සඳහා ලබා දෙන පෝෂණ ආහාර පැකේජය, පාසල් පෝෂණ ආහාර වැඩසටහන සහ පාසල් ළමුන් සඳහා වන සෞඛ්‍ය රක්ෂණය සම්බන්ධයෙන් වූ නව ප්‍රතිපත්ති මුලපිරීම් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙකී වැඩසටහන් සඳහා දරන ලද වියදම් අඩු වීමයි.

දුෂ්කර ප්‍රදේශවල පාසල්වල සිසුන් සඳහා නොමිලේ පෙළපොත්, නිල ඇඳුම් සහ පාවහන් වැනි අධ්‍යාපන සුබසාධන වැඩසටහන් සඳහා අදාළ කාල සීමාව සඳහා වැය වූ මුදල රු. මිලියන 2,592 කි. ගොවිතැන සඳහා රසායනික පොහොර නැවත හඳුන්වාදීම හේතුවෙන් 2022 වර්ෂයේ මුල් මාස හතර තුළ පොහොර සහ බෝග සහනාධාරය සඳහා 2021 වර්ෂයේ එම කාලය සඳහා දරන ලද රුපියල් මිලියන 7,140 ක මුදලට සාපේක්ෂව රුපියල් මිලියන 14,925 ක් දැරීමට රජයට සිදුවිය.

ලෝක බැංකුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ඇතිව රටේ පවතින අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන් සමාජයේ වැඩිම අවදානමකට ලක්විය හැකි කණ්ඩායම් සඳහා නිත්‍ය සුබසාධන වැඩසටහන්වලට අමතරව, අතිරේක සහන සැලසීමට රජය කටයුතු කරමින් සිටී. රජය විසින් "සමෘද්ධි" ප්‍රතිලාභීන් සහ වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයන් හා වකුගඩු රෝගීන් මෙන්ම එම ප්‍රතිලාභී කාණ්ඩවල ලැයිස්තුගත පුද්ගලයන් වැනි අනෙකුත් වර්ගීකරණයන්ට අයත් දීමනාලාභීන් සඳහා අමතර ගෙවීමක් සමගින් රුපියල් 5,000 ක මුදලක් 2022 වසරේ මැයි මස සිට ඔක්තෝබර් මස දක්වා වූ කාල සීමාව සඳහා ලබා දෙනු ලැබේ.

**වගුව 2.10: 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා ප්‍රධාන සුබසාධන වැඩසටහන් සඳහා වියදම්**

රු.මිලියන

| වැඩසටහනේ නම | 2022 (තාවකාලික) |
|---|---|
| **සමාජ සුබසාධනය** | |
| සමෘද්ධි සහනාධාර | 20,679 |
| අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයින් සඳහා ආධාර | 1,437 |
| වැඩිහිටි පුද්ගලයින් සඳහා මූල්‍ය ආධාර | 3,334 |
| වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය ආධාර | 774 |
| රණවිරු මාපිය රැකවරණ, දීමනාව | 634 |
| ගංවතුර හා නියං සහනාධාර | 16 |
| පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා | 110 |
| මියගිය හා තුවාල ලැබූ සොල්දාදුවන් සඳහා සේවා වන්දි | 13,483 |
| **සෞඛ්‍ය හා පෝෂණ** | |
| ත්‍රිපෝෂ වැඩසටහන | 2 |
| ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ මල්ල | 1,129 |
| පාසල් පෝෂ්‍යදායී ආහාර වැඩසටහන | 301 |
| නැවුම් කිරි වැඩසටහන- පාසල් ළමුන් | - |
| පාසල් ළමුන් සඳහා සෞඛ්‍ය රක්ෂණය | 143 |
| පෙර පාසල් ළමුන් සඳහා උදය ආහාරය | 21 |
| රජයේ රෝහල් සඳහා වෛද්‍ය සැපයුම් | 19,655 |
| (ආයුර්වේද රෝහල් සමග) | |
| **අධ්‍යාපනය** | |
| පාසල් පෙළ පොත් | 374 |
| පාසල් නිල ඇඳුම් | 1,244 |
| දුෂ්කර හා අතිදුෂ්කර පාසල් වල ළමුන් සඳහා පාවහන් | 400 |
| ශිෂ්‍යත්ව- 5 ශ්‍රේණියේ සිසුන් | 64 |
| මහපොළ සහ ශිෂ්‍යාධාර | 450 |
| විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට ලැප්ටොප් පරිගණක හා වයිෆයි පහසුකම් සඳහා පොළී සහනාධාර | 1 |
| රාජ්‍ය විශ්ව විද්‍යාල වලට ඇතුළත් වීමට නොහැකි වූ ශිෂ්‍යයින් සඳහා වූ ණය යෝජනා ක්‍රමය | 1.1 |
| දහම් පාසල් ශිෂ්‍යයින් සඳහා පෙළ පොත් | - |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් | 58 |
| **සහනාධාර** | |
| පොහොර සහ බෝග සහනාධාර | 14,925 |
| වෙනත් සහනාධාර | |
| ආර්ථිකමය වශයෙන් ලාභ නොලබන මාර්ග යන්හි ශ්‍රී ල. ග. ම. බස් රථ ධාවනය කරවීම, පාසල් හා උසස් අධ්‍යාපන වාර ප්‍රවේශ පත්‍ර සහ සන්නද්ධ සේවාවන්ට බස් ගමන් අවසර පත් ලබාදීම | 2,850 |
| **එකතුව** | **82,085** |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## ආංශික වියදම

### පාසල් අධ්‍යාපනය

2022 වසරේ පළමු මාස හතර තුළ පාසල් අධ්‍යාපනය වෙනුවෙන් දැරූ වියදම රුපියල් මිලියන 96,707 ක් වන අතර, එයින් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් පිළිවෙළින් රු. මිලියන 95,189 ක් සහ රු. මිලියන 1,518 ක් වේ. ගුරු හා විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතා විසඳීමට ගනු ලැබූ ප්‍රතිපත්ති තීරණය හේතුවෙන් මෙන්ම 2022 වසරේ ජනවාරි මාසයේ සිට රු. 5,000 ක දීමනාවක් ලබා දීම හේතුවෙන් 2021 වසරේ මුල් මාස හතරේ දරා ඇති පුනරාවර්තන වියදමට වඩා 2022 වසරේ එම කාල සීමාවේදී දරා ඇති වියදම සියයට 17 කින් ඉහළ ගොස් ඇත.

විභාග පැවැත්වීමට දරා ඇති වියදම 2021 වසරේ එම කාල සීමාවේ දරා ඇති වියදමට වඩා සියයට 57 කින් අඩු වී ඇති අතර කොවිඩ් 19 වසංගතය හේතුවෙන් විභාග පැවැත්වීමේ සාමාන්‍ය කාල වකවානුව වෙනස් වූ අතර ඒ හරහා වියදම් දැරීමේ රටාව වෙනස් වී ඇත.

2022 වසරේ පළමු මාස හතර තුළ අධ්‍යාපනය වෙනුවෙන් වන විශේෂිත සුබසාධන වියදම් සියයට 18.5 කින් පහළ ගොස් ඇති අතර එය 2021 හි වියදම වූ රු. මිලියන 4,369 සිට රු. මිලියන 3,558 තෙක් අඩු වී ඇත. නැවුම් කිරි වල පැවති හිඟය හේතුවෙන් "කිරි වීදුරුවක් ලබා දීමේ වැඩසටහන" ක්‍රියාත්මක කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයට නොහැකි වී ඇත. කෙසේ වෙතත්, "පාසල් දරුවන්ට ආහාර ලබා දීමේ වැඩසටහන" සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කර ඇත.

**වගුව 2.11: 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා දරන ලද වියදම**

රු.මිලියන

| විස්තරය | 2021 | 2022 (තාවකාලික) |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | |
| පාසල් ගුරුවරුන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල පඩිනඩි | 69,059 | 84,089 |
| ජාතික | 14,224 | 25,519 |
| පළාත් | 54,835 | 58,570 |
| සුභසාධන වැඩසටහන් | 4,369 | 3,558 |
| විභාග ඇගයීම් කටයුතු | 702 | 299 |
| **ප්‍රාග්ධන වියදම්** | | |
| පාසල් පුනරුත්ථාපන හා යටිතල පහසුකම් සංවර්ධනය | 403 | 386 |
| ගුරු සංවර්ධනය | 98 | 10 |
| විශේෂ අධ්‍යාපන සංවර්ධනය | 25 | 59 |
| පළාත් අධ්‍යාපනය | 470 | 582 |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## උසස් අධ්‍යාපනය

රාජ්‍ය වියදම් පාලනය කිරීමෙහි ක්‍රියාමාර්ග හේතුවෙන් 2021 මුල් මාස හතරට සාපේක්ෂව 2022 මුල් මාස හතර තුළ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා වන මුළු වියදම සියයට 8.5 කින් අඩු වූ අතර එය රු. මිලියන 21,280 ක් විය. 2022 ජනවාරි මාසයේ සිට රජයේ නිලධාරින්ට ලබාදුන් රුපියල් 5,000 දීමනාව ද හේතුකොටගෙන පුනරාවර්තන වියදම සියයට 3.5 කින් ඉහළ ගොස් ඇති අතර, එය රුපියල් මිලියන 18,320 ක් වේ. අදාල කාලය තුළ මූලධන වියදම රු. මිලියන 2,960 ක් වූ අතර, එය 2021 වර්ෂයේ එම කාලයට සාපේක්ෂව සියයට 47 කින් පහළ බැසිමකි.

**වගුව 2.12: 2022 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා උසස් අධ්‍යාපනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන වියදම්**

රු.මිලියන

| විස්තරය | 2021 (ජන.-අප්‍රේ.) | 2022 (ජන.-අප්‍රේ.) (තාවකාලික) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | | |
| විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා පුද්ගල පඩිනඩි ගෙවීම් | 15,221 | 16,585 |
| මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් | 600 | 450 |
| මූලධන වියදම | | |
| විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල සංවර්ධනය | 1,595 | 970 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම ( ශ්‍රී ලංකා - කුවේට් රජය) | 574 | 360 |
| විද්‍යා සහ තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය ( ශ්‍රී ලංකා රජය-අ.සං.බැ.) | 904 | 905 |
| වයඹ විශ්වවිද්‍යාලයේ නගර සංවර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා - සෞදි රජය) | 1.6 | 386 |
| ලැප්ටොප් පරිඝණක සඳහා පොළීය (විශ්වවිද්‍යාල සිසුන් සඳහා) | 1 | 1 |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණුව

2022 වර්ෂයේ මුල් මාස හතරෙහි නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණුව සඳහා වූ මුළු වියදම රු. මිලියන 2,494 ක් වූ අතර එයින් පුනරාවර්තන වියදම් රු. මිලියන 2,283 ක් හා මූලධන වියදම රු. මිලියන 211 ක් විය.

**වගුව 2.13: 2022 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා නිපුණතා සංවර්ධනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන වියදම්**

රු.මිලියන

| විස්තරය | 2021 (ජන.-අප්‍රේ.) | 2022 (ජන.-අප්‍රේ.) (තාවකාලික) |
|---|---|---|
| වෘත්තීය අධ්‍යාපන වැඩසටහන වැඩිදියුණු කිරීම | 3 | 36 |
| තාක්ෂණ විද්‍යාල සහ කාර්මික විද්‍යාල 7 ක් නවීකරණය කිරීම* | - | 35 |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

* අයවැය යෝජනාවක් ලෙස 2021 දී ආරම්භ කරන ලදී.

## සෞඛ්‍යය

2022 වර්ෂයේ පළමු මාස හතර තුළ දී බටහිර සහ දේශීය වෛද්‍ය අංශවලින් සමන්විත සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා වන රජයේ මුළු වියදම පළාත් සහ මධ්‍යම රජයේ සෞඛ්‍යය සඳහා වන වියදමද ඇතුළත්ව 2021 වර්ෂයේ එම කාලසීමාව හා සැසඳීමේ දී රු. මිලියන 95,729 ක් දක්වා සියයට 4.8 කින් වැඩි වී ඇත.

**වගුව 2.14: 2022 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා සෞඛ්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන් සඳහා වන වියදම්**

රු.මිලියන

| විස්තරය | 2021 (ජන.-අප්‍රේ.) | 2022 (ජන.-අප්‍රේ.) (තාවකාලික) |
|---|---|---|
| මුළු පුනරාවර්තන වියදම | **83,242** | **87,447** |
| එයින් සේවා සැපයීමේ වියදම | 44,352 | 47,786 |
| වෛද්‍ය නිලධාරීන් සහ කාර්ය මණ්ඩල වැටුප් සඳහා වන වියදම | 34,693 | 37,233 |
| වෛද්‍ය සැපයීම් | 20,143 | 19,637 |
| පළාත් සෞඛ්‍ය | 18,747 | 20,024 |
| රාජ්‍ය ආයෝජන වියදම | **8,054** | **8,281** |
| වෛද්‍ය උපකරණ | 1,282 | 172 |
| සෞඛ්‍ය පද්ධතීන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - ADB | 824 | 286 |
| කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය (ලෝක බැංකුව) | 804 | 3,323 |
| කරාපිටිය, අම්පාර, යාපනය රෝහල්වල ළමා රෝග රැකවරණ මධ්‍යස්ථාන පිහිටුවීම | 185 | - |
| තෝරාගත් රෝහල්වල සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම | 175 | 449 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්වල හදිසි අනතුරු ඒකකවල පහසුකම් වැඩිදියුණු කිරීම | 109 | 58 |
| බාහිර රෝගී සේවා සංකීර්ණය සංවර්ධනය - කොළඹ ජාතික රෝහල (ශ්‍රී ලංකා රජය - චීන රජය) | 98 | 2 |
| ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන් සඳහා ඉහළ ගුණාත්මක භාවයකින් යුත් අධිශක්ති විකිරණ ප්‍රතිකාර ලබා දීම | 69 | - |
| හෙද පීඨය/ නේවාසිකාගාරය ඉදිකිරීම | 5 | 50 |
| වෙනත් මූලධන ආයෝජන | 4,493 | 2,924 |
| පළාත් සෞඛ්‍ය ආයෝජන | 1,377 | 1,017 |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

2022 වර්ෂයේ පළමු මාස හතර තුළ දී බටහිර සහ දේශීය වෛද්‍ය අංශවලින් සමන්විත සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා වන රජයේ මුළු වියදම පළාත් සහ මධ්‍යම රජයේ සෞඛ්‍යය සඳහා වන වියදම ද ඇතුළත්ව 2021 වර්ෂයේ එම කාලසීමාව හා සැසඳීමේ දී රු. මිලියන 95,729 ක් දක්වා සියයට 4.8 කින් වැඩි වී ඇත. සෞඛ්‍යය සඳහා වන මුළු වියදමින් රු. මිලියන 87,447 ක් පුනරාවර්තන වියදම් සඳහා වන අතර මූලධන ආයෝජනය රු. මිලියන 8,281 කි. පුනරාවර්තන වියදම්වල ප්‍රධාන කාණ්ඩ වලින් එකක් වන වෛද්‍ය සැපයුම් සංරචකය යටතේ කරන ලද මුළු වියදම වන රු. මිලියන 20,143 ක් වියදම් කර ඇත්තේ ඖෂධ, ශල්‍ය උපකරණ සහ රසායනාගාර අයිතම සඳහාය.

## වාරිමාර්ග හා ජල කළමනාකරණය

2022 වසරේ පළමු මාස හතර තුළ වාරිමාර්ග හා ජල කළමනාකරණය සඳහා වූ මුළු ආයෝජනය රු. මිලියන 11,364 කි. 2021 වසර සමග සැසඳීමේදී එය 29.9 ක පමණ වර්ධනයකි. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන ඇතුළු මහවැලි ආශ්‍රිත ප්‍රදේශවල වාරිමාර්ග පද්ධති සංවර්ධනය කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා 2021 වසරෙහි දී රු. මිලියන 8,807 ක් වැයකර ඇති නමුත් 2022 වසරේ දී ඒ සඳහා රු. මිලියන 4,304 ක මුදලක් වැය කර ඇත. වාරිමාර්ග අමාත්‍යාංශය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් වාරි පද්ධතියේ සංවර්ධනය සඳහා ඉතිරි රු. මිලියන 8,460 ක මුදල වැය කරන ලදි.

## කෘෂිකර්මය

පශු සම්පත්, වැවිලි, ධීවර හා ඉඩම් සංවර්ධනය යන උප අංශයන්ද ඇතුලත්ව කෘෂිකර්ම අංශය සඳහා 2022 වසරේ පළමු මාස හතර තුල රු. මිලියන 20,195 ක වියදමක් දරා ඇත. එය 2021 එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 15 ක පමණ වැඩි වීමකි. මෙම මුදලින් රු. මිලියන 14,599 ක් පොහොර නිෂ්පාදනය, බෙදා හැරීම, නියාමනය සහ රසායනික පොහොර සහ කෘමිනාශක භාවිතය වෙනුවෙන් වියදම් කර ඇත. තවද කෘෂිභෝග සඳහා රු. මිලියන 3,858 ක් සහ වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රු. මිලියන 1,369 ක් ද, ධිවර ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රු. මිලියන 290 ක් ද, ඉඩම් සංවර්ධනය සඳහා රු. මිලියන 18 ක් ද, වියදම් දරා ඇති අතර ඉතිරිය පශු සම්පත් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සහ ප්‍රතිලාභීන්ට අවශ්‍ය පහසුකම් ලබා දීම වෙනුවෙන් වැය කර ඇත.

## ජල සම්පාදන හා සනීපාරක්ෂාව

සුරක්ෂිත පානීය ජලය සහ ගුණාත්මක සනීපාරක්ෂක සේවා ලබා ගැනීම සදහා දේශීය සහ විදේශීය බැංකුවලින් ලබා ගත් ණය සේවාකරණය ඇතුළුව රු. මිලියන 8,115 ක වියදමක් 2022 වසරේ පළමු මාස හතරක කාලය තුළ රජය විසින් දරා ඇති අතර එය 2021 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 72.4 ක වැඩි වීමකි. සමස්ත ජනතාවට සුරක්ෂිත පානීය ජලය ලබා දීම සහතික කිරීම සඳහා ව්‍යාපෘති 248 කින් සමන්විත, නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම, නව ජල සම්පාදන යෝජනා ක්‍රම ඇති කිරීම සහ දැනට ක්‍රියාත්මක වන ව්‍යපෘති කඩිනම් කිරීම අරමුණු කරගත් "සැමට ජලය" ජාතික වැඩසටහන 2022 වසරේත් ක්‍රියාත්මක වේ.

**වගුව 2.15: 2022 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා තෝරාගත් ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘති වියදම්**

රු.මිලියන

| ව්‍යාපෘතිය | 2022 (ජන.-අප්‍රේ.) (තාවකාලික) |
|---|---|
| " සැමට ජලය " දිවයින පුරා ක්‍රියාත්මක වන ජල සම්පාදන වැඩසටහන | 1,633 |
| මහනුවර උතුර හා පාතදුම්බර ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය ( ශ්‍රී ලංකා රජය / චීනය ) | 1,619 |
| මහ මාතලේ ජල සැපයුම් ව්‍යාපෘතිය ( ශ්‍රී ලංකා රජය / ප්‍රංශය ) | 1,000 |
| මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණ වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 2 (ශ්‍රී ලංකා රජය / ආසියානු සංවර්ධන බැංකුව ) | 733 |
| මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණ වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 3 (ශ්‍රී ලංකා රජය / ආසියානු සංවර්ධන බැංකුව ) | 705 |
| දැදුරුඔය ජල සැපයුම් ව්‍යාපෘතිය ( ශ්‍රී ලංකා රජය / කොරියාව ) | 563 |
| ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘති (ශ්‍රී ලංකා රජය - ලෝක බැංකුව) | 324 |
| අඹතලේ ජල සැපයුම් පද්ධතිය වැඩි දියුණු කිරීම සහ බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය / ප්‍රංශය ) | 290 |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## මහාමාර්ග හා පාලම්

2022 වර්ෂයේ පළමු මාස හතර තුළ මාර්ග හා පාලම් සඳහා වියදම රු. මිලියන 36,398 ක් වූ අතර එය 2021 වර්ෂයේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 6 කින් පමණ අඩු වීමකි. එයින් රු. මිලියන 16,123 ක් ජාතික හා ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා වැය කර ඇත. මේ යටතේ රු. මිලියන 10,613 ක මුදලක් ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන (i-Road) සඳහා වැය කර ඇති අතර එමඟින් කි.මී. 6,000 කට අධික ග්‍රාමීය හා පළාත්බද මාර්ග පිළිසකර කිරීම හා වැඩිදියුණු කිරීම ඉලක්ක කොට ගෙන ඇත. තවද, විශේෂයෙන්ම, ග්‍රාමීය ප්‍රදේශවල සම්බන්ධිතතාවය වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් ප්‍රධාන මාර්ග වලට ප්‍රවේශ වීම සඳහා මෙන්ම නාගරික ප්‍රදේශවල මාර්ග තදබදයට විසඳුමක් වශයෙන් කි.මී. 100,000 ක විකල්ප මාර්ග සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 2,436 ක් වැය කර ඇත.

අධිවේගී මාර්ග සංවර්ධනය සඳහා වියදම රු. මිලියන 1,430 ක් වූ අතර එයින් සැලකිය යුතු ප්‍රමාණයක් කණු මත දිවෙන (Elevated) වරාය පිවිසුම් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වැය කර ඇත. මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා වූ වියදම රු. මිලියන 113 ක් වූ අතර පාලම් සංවර්ධනය හා ගුවන් පාලම් ඉදිකිරීම සඳහා වැය වූ මුදල රු. මිලියන 606 කි.

කණු මත දිවෙන (Elevated) වරාය පිවිසුම් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය, ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන, මධ්‍යම හා ඌව පළාත්වල මාර්ග හා පාලම් පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සහ කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් සැලසුම් කිරීම හා ඉදිකිරීම යන ව්‍යාපෘති සම්බන්ධයෙන් 2022 වසරේ පළමු මාස හතර සඳහා වූ ඉලක්කගත ප්‍රගතිය අත්කර ගැනීමට හැකි විය. එමෙන්ම, මාර්ග පිළිසකර කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දේශීය බැංකු වලින් ලබාගත් ණය සහ අදාල පොළී වශයෙන් රු. මිලියන 14,380 ක් පමණ ගෙවා ඇත.

## ප්‍රවාහන

2022 වර්ෂයේ පළමු මාස හතරක කාල සීමාව සඳහා ප්‍රවාහන අංශය වෙනුවෙන් රජය කරන ලද මුළු වියදම රු. මිලියන 12,320 ක් වන අතර එය 2021 වර්ෂයේ අදාල කාලයට සාපේක්ෂව සියයට 9.3ක අඩුවීමකි. මහජනතාවට කාර්යක්ෂම හා ආරක්ෂිත ප්‍රවාහන සේවාවක් ලබාදීමේ අරමුණින් ප්‍රවාහන අංශය සඳහා මෙම වියදම දරන ලදි. එයින් රු. මිලියන 9,190 ක් හා රු. මිලියන 3,130 ක් පිළිවලින් පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කර ඇත. කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය, මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීම, පවතින දුම්රිය මාර්ග නඩත්තු කටයුතු කිරීම සහ දුම්රිය ඇණියේ සුළු හා මහා පරිමාණ අළුත්වැඩියාව යන ව්‍යාපෘති වෙනුවෙන් රු. මිලියන 2,731 ක වියදමක් දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් දරන ලදී.

පළමු මාස හතරෙහි මෙම අංශයට රජය විසින් දරන ලද මුළු වියදමින් රු. මිලියන 2,850 ක් ආර්ථිකමය වශයෙන් ලාභ නොලබන මාර්ගයන්හි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ ධාවනය කරවීම, පාසල් හා උසස් අධ්‍යාපන වාර ප්‍රවේශ පත්‍ර සහ සන්නද්ධ සේවාවන්ට බස් ගමන් අවසර පත් ලබාදීම යන සුභ සාධක සේවාවන් සඳහා වියදම් දරා ඇත. එසේම වාහන ලියාපදිංචියට අදාල අංක තහඩු ලබාදීම හා රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ කටයුතු වෙනුවෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 224 ක වියදමක් දරන ලදී.

## නිවාස සංවර්ධනය

පවතින ආර්ථික පසුබිම තුළ දේශීය හා විදේශීය ආධාර අරමුදල් යටතේ 2022 වර්ෂයේ පළමු මාස හතර තුළ නිවාස හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් ඉදිකිරීම වෙනුවෙන් රජය විසින් ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන සලසා දෙන ලදි. නිවාස අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමට පළමු මාස හතර තුළ රු. මිලියන 1,351 ක් වැය කළ අතර එය 2021 වර්ෂයේ අදාල කාලයට සාපේක්ෂව සියයට 44.4 ක පසුබෑමකි. එයින් රු. මිලියන 603 ක් ග්‍රාමීය, නාගරික, වතු "විරි සුමිතුරු" සහ වකුගඩු රෝගයට ගොදුරුවූවන් ඇතුළු අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරීමට වියදම් කරන ලදි.

## නාගරික සංවර්ධනය

2022 පළමු මාස හතර සඳහා නාගරික සංවර්ධනය වෙනුවෙන් රජය විසින් රු. මිලියන 5,408 ක වියදමක් කර ඇත. එය 2021 වර්ෂයේ 2021 වර්ෂයේ අදාළ කාලයේ වාර්තා වූ රු. මිලියන 4,868 ට සාපේක්ෂව සියයට 11.1 ක වර්ධනයකි. එයින් රු. මිලියන 393 ක් පුනරාවර්තන වියදම් ලෙසත් රු. මිලියන 5,015 ක් ප්‍රාග්ධන වියදම් ලෙසත් වැය කර ඇත. නාගරික අංශයේ මුළු වියදමින් රු. මිලියන 4,680 ක් කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය, නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය, උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (මහනුවර, ගාල්ල හා යාපනය), වේරුස් ගඟ ව්‍යාපෘතිය, සියක් නගර වැඩසටහන සහ පළාත් නගර සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කර ඇත.

**වගුව 2.16:** 2022 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා මහාමාර්ග හා පාලම් සඳහා වන වියදම

රු.මිලියන

| | ව්‍යාපෘතිය/ වැඩසටහන | 2021 (ජන.-අප්‍රේ.) | 2022 (ජන.-අප්‍රේ.) (තාවකාලික) |
|---|---|---|---|
| 1 | **අධිවේගි මාර්ග සංවර්ධනය** | **520** | **1,430** |
| | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | 444 | 238 |
| | කොළඹ - රත්නපුර - පැල්මඩුල්ල අධිවේගී මාර්ගය | 23 | 117 |
| | කණු මත දිවෙන නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා වන අධිවේගී මාර්ගය | 31 | 54 |
| | කණු මත දිවෙන වරාය නගර අධිවේගී මාර්ගය | 22 | 1,021 |
| 2 | **මහාමාර්ග සංවර්ධනය** | **22,527** | **16,123** |
| | මාර්ග නඩත්තුව | 1,503 | 688 |
| | කොළඹ දිස්ත්‍රික් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 664 | 158 |
| | දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 267 | 438 |
| | ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන | 12,055 | 10,613 |
| | මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම | 30 | 1,200 |
| | ප්‍රධාන මාර්ග හා අධිවේගී මාර්ග වෙත ප්‍රවේශය සඳහා සහ මාර්ග තදබදය අවම කිරීම සඳහා විකල්ප මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීම | 7,371 | 2,436 |
| | අනෙකුත් මාර්ග සංවර්ධනය | 637 | 590 |
| 3 | **මාර්ග පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීම** | **1,437** | **113** |
| 4 | **පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම** | **118** | **606** |
| | ජාතික මාර්ග ජාලයේ හානි වූ සහ දුර්වල පාලම් පුනරුත්ථාපනය | 52 | 32 |
| | පරණ පාලම් කොටස් යොදා ගනිමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම | 16 | 303 |
| | දෙවන නව කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 32 | 21 |
| | කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් දෙකක් සැලසුම්කොට ඉදිකිරීම | - | 226 |
| | අනෙකුත් ( ගුවන් පාලම් ද ඇතුළුව) | 18 | 24 |
| 5 | **ස්වාභාවික ව්‍යසන වලින් බලපෑමට ලක්වූ මාර්ග පුනරුත්ථාපනය** | **38** | **12** |
| 6 | **මඟනැගුම, ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන** | **16** | **1,134** |
| 7 | **මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා මාරු කිරීම්** | **2,590** | **2,550** |
| 8 | **ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම (ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති හැර අනෙකුත් ව්‍යාපෘති )** | **391** | **50** |
| 9 | **මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය හිගය පියවීම සඳහා ලබාදුන් මුදල් දායකත්වය** | **11,339** | **14,380** |
| 10 | **අනෙකුත්** | **-** | **-** |
| | **එකතුව** | **38,796** | **36,398** |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

### භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය

2022 වර්ෂයේ මුල් මාස හතර තුළ භාණ්ඩාගාරයට ආදායම් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් මුදල් ගලාඒම් රුපියල් බිලියන 598.5 ක් වූ අතර එය රුපියල් බිලියන 613.7 ක ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 97.5 කි. මේ අතර 2022 වර්ෂයේ මුල් මාස හතර තුළ පුනරාවර්තන හා රාජ්‍ය ආයෝජන සඳහා මුදල් ගලායාම් රුපියල් බිලියන 1,249.3 ක් වූ අතර එය රුපියල් බිලියන 1,210.2 ක් වූ ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 103.2 කි. මෙය 2021 වර්ෂයේ අදාළ කාලපරිච්ඡේදයේ රුපියල් බිලියන 1,022.7 සමඟ සැසඳීමේ දී සියයට 22.2 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

2022 අප්‍රේල් 30 දිනට මුළු මුදල් හිඟය රුපියල් බිලියන 650.8 ක් වූ අතර 2021 වර්ෂයේ අප්‍රේල් 30 දිනට පැවති රුපියල් බිලියන 563.6 ට සාපේක්ෂව එය සියයට 15.5 වැඩිවීමකි. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ මෙහෙයුම් වියදම් සහ රාජ්‍ය ආයෝජන පිළිවෙලින් සියයට 14.8 කින් සහ සියයට 64.5 කින් වැඩිවීමයි. 2022 වර්ෂයේ අප්‍රේල් 30 දිනට සමස්ත මුදල් හා බැංකු ශේෂ හිඟය රුපියල් බිලියන 230.3 ක් දක්වා අඩු වූ අතර, එය 2021 වර්ෂයේ අප්‍රේල් 30 දිනට රුපියල් බිලියන 620.5 ක් විය.

**වගුව 2.17: 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා රජයේ මුදල් ප්‍රවාහ ක්‍රියාකාරිත්ව ප්‍රකාශය**

**රජයේ මුදල් ප්‍රවාහ ක්‍රියාකාරිත්වය** රු. බිලියන

| අයිතමය | ජනවාරි - අප්‍රේල් | | |
|---|---|---|---|
| | 2021 | 2022 | |
| | තත්‍ය | ඇස්තමේන්තුව | තත්‍ය |
| ආරම්භක මුදල් ශේෂය | -488.2 | -831.6 | -831.6 |
| ආදායම් හා වෙනත් ලැබීම් මගින් සමස්ථ මුදල් ගලා ඒම | 459.1 | 613.7 | 598.5 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වල සමස්ථ මුදල් ගලා යෑම් | -870.4 | -986.9 | -998.8 |
| ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලායාම් * | -152.3 | -223.3 | -250.5 |
| ශුද්ධ මුදල් අතිරික්තය / (හිඟය) | -563.6 | -596.5 | -650.8 |
| දළ ණය ගැනීම් * | 732.5 | 1,786.9 | 1,754.1 |
| ණය ආපසු ගෙවීම් | -310.7 | -520.8 | -605.6 |
| ශුද්ධ ණය ගැනීම් | 421.8 | 1,266.1 | 1,148.5 |
| පෙර වසරේ ස්වෛරීත්ව බැඳුම්කර ශේෂය | - | - | 4.5 |
| ගැලපීම් ගිණුමේ ශේෂය (ටී ඊ බී / ශුද්ධ තැන්පතු යනාදිය) | 9.5 | - | 99.1 |
| අවසාන මුදල් ශේෂය | -620.5 | -161.9 | -230.3 |

මූලාශ්‍රය: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
* භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2022 අප්‍රේල් 30 දින ගිවිසුම්ගත කරන ලද ව්‍යාපෘති/වැඩසටහන් ණය ඇතුළත් වේ

### රාජ්‍ය ණය කළමනාකරණය


2022 වර්ෂයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මුළු ණය ගැනීම් සීමාව රුපියල් බිලියන 3,200 ක් වන අතර, 2022 වර්ෂයේ ජනවාරි 01 වනදා සිට අප්‍රේල් මස 30 වනදා දක්වා කාලය තුළ රජයේ ණය භාවිතය රුපියල් බිලියන 1,754.1 කි. මෙම කාලය තුළ දී මුදල් ප්‍රවාහ මෙහෙයුම් හා සංවර්ධන ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා දේශීය හා විදේශීය වශයෙන් පිළිවෙලින් රුපියල් බිලියන 1,600.7 ක සහ රුපියල් බිලියන 153.4 ක මුළු ණය ලබාගෙන ඇත. 2022 වර්ෂයේ පළමු මාස හතර තුළ සියයට 91.3 ක්ම දේශීය ණය ගැනීම් වලින් සමන්විත විය. භාණ්ඩාගාර බැදුම්කර, භාණ්ඩාගාර බිල්පත් සහ ශ්‍රී ලංකා මහ බැංකු අත්තිකාරම් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැදුම්කර දේශීය ණය ගැනීමේ ප්‍රධාන ප්‍රභවයන් විය. ඒ අනුව 2022 මුල් මාස හතර තුළ සමස්ත දේශීය ණය වලින් සියයට 60 ක් පමණ භාණ්ඩාගාර බැදුම්කර මගින් ලබාගෙන ඇති අතර සියයට 31 ක් භාණ්ඩාගාර බිල්පත් නියෝජනය කරන අතර තවත් සියයට 8 ක් ශ්‍රී ලංකා මහ බැංකු අත්තිකාරම් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මගින් ලබාගෙන ඇත. සමාලෝචනයට භාජනය වූ කාලසීමාව අවසන් වන විට ශුද්ධ ණය ගැනීම රුපියල් බිලියන 1,148.5 කි.

**වගුව 2.18: 2022 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා දේශීය දළ ණය ගැනීම්**

| | රු. බිලියන |
|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 1,003.5 |
| භාණ්ඩාගාර බිල්පත් (ශුද්ධ) | 518.2 |
| මහ බැංකුවේ තාවකාලික අත්තිකාරම් | 73.8 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 65.6 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය ආපසු ගෙවීම් | (60.4) |
| එකතුව | **1,600.7** |

මූලාශ්‍රය: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

**රූප සටහන 2.3: දේශීය දළ ණය ගැනීම් (2022 ජනවාරි -අප්‍රේල්)**




මූලාශ්‍රය: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## භාණ්ඩාගාර ඇපකර මත වගකීම් හෙළිදරව් කිරීම

2022 අප්‍රේල් 30 වන දිනට නිකුත් කළ හා එදිනට පවතින භාණ්ඩාගාර ඇපකර වල වටිනාකම රුපියල් බිලියන 2,768.2 ක් වන අතර එය 2016 අංක 13 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතේ දෙවන වගන්තිය ප්‍රකාරව නිකුත් කර ඇත.

2022 අප්‍රේල් 30 වන දිනට මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව වගු අංක 2.19 හි දක්වා ඇත.

**වගුව 2.19: මහා භාණ්ඩාගාරය විසින් 2022.04.29 දින දක්වා නිකුත් කරන ලද භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව**

| අනු අංකය | බැංකුවේ හෝ ආයතනයේ නම | ආයතනයේ නම | රු.මිලියන | එකතුව |
|---|---|---|---|---|
| 1 | මහජන බැංකුව | බීසීසී ලංකා සමාගම | 300.00 | |
| | | ලංකා විදුලිබල මණ්ඩලය | 27,178.07 | |
| | | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 596,778.84 | |
| | | සීමාසහිත ලංකා නැව් සංස්ථාව | 25,887.67 | |
| | | සීමාසහිත ලංකා ගල් අඟුරු (පෞද්ගලික) සමාගම | 28,000.00 | |
| | | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 7,475.25 | |
| | | ජාතික කඩදාසි සංස්ථාව | 140.00 | |
| | | වී අලෙවි මණ්ඩලය | 1,097.83 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 58,184.52 | |
| | | රාජ්‍ය මුද්‍රණ සංස්ථාව | 1,350.00 | |
| | | ශ්‍රී ලන්කන් ගුවන් සමාගම | 16,789.57 | |
| | | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 100.00 | |
| | | ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | 6,485.09 | |
| | | සී/ස ලංකා සතොස සමාගම | 2,241.00 | 772,007.84 |
| 2 | ලංකා බැංකුව | සීමාසාහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | 500.00 | |
| | | ලංකා විදුලිබල මණ්ඩලය | 5,000.00 | |
| | | ලංකා ධීවර සංස්ථාව | 250.00 | |
| | | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 593,997.86 | |
| | | ඇල්කඩුව වැවිලි සමාගම | 30.00 | |
| | | ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | 835.00 | |
| | | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 340.00 | |
| | | සීමාසහිත ලංකා ගල් අඟුරු (පෞද්ගලික) සමාගම | 22,000.00 | |
| | | ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම | 6,000.00 | |
| | | සීමාසහිත ව්‍යාපාර කළමනාකරණ ජාතික පාසල | 8,600.00 | |
| | | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 71,848.44 | |
| | | නොර්ත්සි ලිමිටඩ් | 38.63 | |
| | | වී අලෙවි මණ්ඩලය | 500.00 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 148,393.41 | |
| | | සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සේවය | 13,049.95 | |
| | | රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව | 1,000.00 | |
| | | ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාව | 200.00 | |
| | | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 2,400.00 | |
| | | නාගරික සංවර්ධන අධිකාරිය | 2,189.88 | 877,173.18 |

| අනු අංකය | බැංකුවේ හෝ ආයතනයේ නම | ආයතනයේ නම | රු.මිලියන | එකතුව |
|---|---|---|---|---|
| 3 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 7,500.00 | |
| | | ජෙනරාල් ශ්‍රීමත් ජොන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | 42,747.79 | |
| | | ලක්දනවි ලිමිටඩ් | 2,992.00 | |
| | | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 32,710.61 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 122,615.66 | |
| | | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | 3,500.00 | |
| | | නාගරික සංවර්ධන අධිකාරිය | 2,770.00 | |
| | | තාක්ෂණික උද්‍යාන සංවර්ධන (පුද්.) සමාගම | 1,500.00 | 216,336.06 |
| 4 | කොමර්ෂල් බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 968.36 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 4,755.93 | 5,724.29 |
| 5 | ඩීඑෆ්සීසී බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 6,026.24 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 5,896.51 | 11,922.75 |
| 6 | චීන එක්සිම් බැංකුව | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 31,915.68 | 31,915.68 |
| 7 | හැටන් නැෂනල් බැංකුව | ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 4,000.00 | |
| | | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 16,458.52 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 20,133.15 | 40,591.67 |
| 8 | හොංකොං සහ ෂැංහයි බැංකු සමාගම | ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 15,889.61 | 67,372.51 |
| | | වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම | 51,482.90 | |
| 9 | සීමාසහිත චීන කර්මාන්ත හා වාණිජ බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 15,110.01 | 15,110.01 |
| 10 | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (ජයිකා) | ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 206,600.47 | 206,600.47 |
| 11 | ජාතික සංවර්ධන බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 21,380.43 | |
| | | වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම | 6,299.21 | 27,679.63 |
| 12 | ඉන්දියන් එක්සිම් බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 92,411.67 | 92,411.67 |
| 13 | චීන සංවර්ධන බැංකුව | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 22,487.93 | 22,487.93 |
| 14 | ආසියානු සංවර්ධන බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 167,399.40 | 167,399.40 |
| 15 | සම්පත් බැංකුව | මාර්ග සංවර්ධන අධිකාරිය | 14,500.00 | 14,500.00 |
| 16 | යුනික්‍රෙඩිට් බැංකුව, ඔස්ට්‍රියා AG | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 19,319.90 | 19,319.90 |
| 17 | අයි. එන්. ජී, බැංකුව, නෙදර්ලන්තය | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 31,672.39 | 31,672.39 |
| 18 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 4,319.98 | 4,319.98 |
| 19 | සීමාසහිත වයිනා ජාතික රසායනික ඉංජිනේරු අංක 14 ඉදිකිරීම් සමාගම | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 15,758.94 | 15,758.94 |
| 20 | ඩීබී ට්‍රස්ටිස් (හොංකොං) ලිමිටඩ් | සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සේවය | 62,999.77 | 62,999.77 |
| 21 | ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව | නොර්ත්සි ලිමිටඩ් | 60.00 | 60.00 |
| 22 | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) | ලංකා බැංකුව සහ මහජන බැංකුව | 64,799.77 | 64,799.77 |
| | | එකතුව | 2,768,163.84 | 2,768,163.84 |

මූලාශ්‍රය: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

# 3 වන පරිච්ඡේදය
# රජය සතු ව්‍යාපාරයන්හි කාර්යසාධනය

## සමාලෝචනය

2022 මුල් මාස හතර තුළ රාජ්‍ය ව්‍යාපාරයන් කැපී පෙනෙන මූල්‍ය මෙන්ම මෙහෙයුම් අභියෝගයන්ට මුහුණදෙන ලදී. විදේශ විනිමය ද්‍රවශීලතා හිඟතාවය මත, විශේෂයෙන්ම බලශක්ති ක්ෂේත්‍රය හා ප්‍රවාහන ක්ෂේත්‍රයන් ඇතුළුව ප්‍රධානතම රාජ්‍ය ව්‍යාපාරවල සැපයුම්දාම කළමනාකරණයට දැඩි ඍණාත්මක බලපෑමක් ඇති විය. මෙම ඍණාත්මක බලපෑම සමස්ත ආර්ථිකය කෙරෙහිම දැඩි ලෙස බලපෑම් එල්ල කර ඇත.

මෑතක දී හඳුන්වා දුන් පිරිවැය පිළිඹිබු කරන මිල යාන්ත්‍රණය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළද, තවදුරටත් ගැටළු රාශියක් සඳහා විසඳුම් ලබාදිය යුතුව ඇත. විදේශ මුදල් ඒකක වලින් ණය ශේෂයන් පැවතීම මත විශාල විනිමය අලාභ ඇති වීම මගින් රාජ්‍ය මූල්‍ය කෙරෙහි මෙන්ම රාජ්‍ය බැංකු වෙත දැඩි බලපෑමක් ඇති කරන බැවින්, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ දීර්ඝකාලීනව පවතින ප්‍රමාණාත්මක ණය ශේෂ මෙම ගැටළුවේදී ප්‍රධානතම සාධකයක් බවට පත් වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ, 2022 අප්‍රේල් මස අග වන විට ඍණ ශුද්ධ වත්කම් ප්‍රමාණය රු. බිලියන 986 ක් දක්වා බාදනය වී ඇත. ලංකා විදුලිබල මණ්ඩලය සලකා බලන විට වසර 8 කට ආසන්න කාලපරිච්ඡේදයක් තුළ විදුලි බිල සංශෝධනයක් සිදු කර නොමැති තත්ත්වය එම ආයතනයේ සමුච්චිත අලාභය රු. බිලියන 236 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ යාමට බලපා ඇත. ලෝක වෙළඳපොලේ ඉන්ධන හා ගල් අඟුරු මිල ඉහළ යාම මෙන්ම රුපියල අවප්‍රමාණය වීම මත ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම් පිරිවැය කැපී පෙනෙන අන්දමින් ඉහළ ගොස් ඇති අතර, මෙම ක්ෂේත්‍රයේද මිල සංශෝධනයක් ඉතාමත් කඩිනමින් සිදු කළ යුතුව ඇත. රට තුළ ආර්ථික කටයුතු යථාවත් කිරීමෙහිලා ස්ථාවර හා අඛණ්ඩ බලශක්ති සැපයුමක් තහවුරු කිරීම සඳහා මෙම ක්ෂේත්‍රය නියෝජනය කරන ප්‍රධානතම රාජ්‍ය ව්‍යාපාරයන් දෙකෙහි මූල්‍ය තත්ත්වයෙහි ස්ථාවරත්වය ඇති කිරීම සඳහා පිළියම් යෙදීම ඉතාමත් වැදගත් වේ.

රාජ්‍ය මූල්‍ය කෙරෙහි තවත් දැඩි බලපෑමක් ඇති කරන ආයතනයක් ලෙස ශ්‍රී ලංකන් ගුවන් සමාගම දැක්විය හැක. 2021/2022 මූල්‍ය වර්ෂය තුළ එම සමාගම රු. බිලියන 171 ක පමණ අලාභයක් වාර්තා කරමින් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ගැටළු සහගත තත්ත්වයකට පත්ව ඇත. මූල්‍ය අලාභයට අමතරව ශ්‍රී ලංකන් ගුවන් සමාගම, සංචාරකයින් අඩුවීම මත දැඩි ලෙස ආදායම් අහිමි වීම, ගුවන්යානා ඉන්ධන මිල ඉහළ යාම මෙන්ම මූල්‍ය පිරිවැය ඉහළ යාමේ තත්ත්වයන් තුළ එහි බාහිර වගකීම් නියමිත කාලයට ගෙවීමෙහිලා අභියෝගයකට මුහුණ පා ඇත.

2022 පළමු මාස හතර තුළදී, ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාරයන් 52 විසින් රු. බිලියන 859 ක පමණ කැපී පෙනෙන අලාභයක් වාර්තා කර ඇති අතර එය 2021 එම කාලපරිච්ඡේදය සඳහා වාර්තා කරන ලද රු. බිලියන 13 ක අලාභය සමග සසඳා බැලීමේදී එය ඉතා විශාල පසුබෑසීමකි. මෙම අලාභය සඳහා ප්‍රධානතම සාධකය ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් වාර්තා කරන ලද විදේශ විනිමය අලාභය හඳුනාගත හැක. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ විදේශ විනිමය මත ඇති වූ අලාභය පමණක් 2022 මුල් මාස හතර දී රු. බිලියන 549 ක් පමණ වී ඇත.

2021 අනුරූපී කාලපරිච්ඡේදය සමග සසඳා බලන කල භාණ්ඩාගාරය විසින් අයබදු හා ලාභාංශ එකතුකිරීම සියයට 67 ක වර්ධනයක් සහිතව 2022 මුල් මාස හතරක කාලය තුළ රු. බිලියන 11.4 ක් රැස් කිරීමට සමත්ව ඇත.

## රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය

### ලංකා බැංකුව

2021 මූල්‍ය වර්ෂය අවසන් වන විට රුපියල් බිලියන 3,803 ක් වූ ලංකා බැංකුවේ වත්කම් පදනම 2022 අප්‍රේල් මස අවසන් වන විට රු. බිලියන 4,366 ක් දක්වා සියයට 14.8 කින් ඉහළ නංවා ගැනීමට ලංකා බැංකුවට හැකියාව ලැබී ඇත. 2021 අවසානය වන විට රු. බිලියන 2,867 ක් වූ ලංකා බැංකුවේ තැන්පතු ප්‍රමාණය 2022 අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 3,256 ක් දක්වා සියයට 13.5 න් ඉහළ ගොස් ඇත. 2021 අවසන් වන විට සියයට 4.4 ක් වූ දල අක්‍රීය ණය අනුපාතය, 2022 අප්‍රේල් මස අවසානය වන විට සියයට 5.2 ක් දක්වා ඉහළ ගොස් ඇත. 2021 මූල්‍ය වර්ෂයේ මුල් මාස හතර සඳහා වාර්තා කරන ලද රු. බිලියන 19.6 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2022 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය සඳහා රු. බිලියන 19.9 ක බදු පෙර ලාභයක් වාර්තා කර ගැනීමට ලංකා බැංකුව සමත්ව ඇත.

### මහජන බැංකුව

2021 මූල්‍ය වර්ෂය අවසන් වන විට රු. බිලියන 2,648 ක් වූ මහජන බැංකුවේ වත්කම් පදනම 2022 අප්‍රේල් මස අවසන් වන විට රු. බිලියන 3,136 ක් දක්වා සියයට 18.4 කින් වර්ධනය වී ඇත. 2021 අවසානය වන විට රුපියල් බිලියන 2,072 ක් වූ තැන්පතු ප්‍රමාණය 2022 අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 2,268 ක් දක්වා ඉහළ ගොස් ඇත. එසේම, 2021 වර්ෂය අවසානය වන විට පැවැති රු. බිලියන 1,937 ක් වූ ණය කළඹේ වටිනාකම 2022 අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 2,014 ක් දක්වා සියයට 3.9 කින් ඉහළ ගොස් ඇත. 2021 වර්ෂය අවසානය වන විට සියයට 3.2 ක් වූ දළ අක්‍රීය ණය අනුපාතය 2022 අප්‍රේල් මස අවසානය වන විට සියයට 4.1 ක් දක්වා වශයෙන් ඉහළ ගොස් ඇත. 2021 සමගාමී කාලපරිච්ඡේදය තුළ

වාර්තා කළ රු. බිලියන 8.0 ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට 2022 අප්‍රේල් මාසය දක්වා මුල් මාස හතර තුළ මහජන බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 9.6 ක් ලෙස වාර්තා වී ඇත.

### ජාතික ඉතිරිකිරීමේ බැංකුව

2021 මූල්‍ය වර්ෂය අවසන් වන විට රු. බිලියන 1,579 ක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පතු පදනම, 2022 අප්‍රේල් මස අවසන් වන විට රු. බිලියන 1,623 ක් දක්වා සියයට 2.7 කින් වර්ධනය වී ඇත. 2021 අවසානය වන විට රු. බිලියන 1,428 ක් වූ තැන්පතු පදනම 2022 අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 1,462 ක් දක්වා සියයට 2.3 කින් වර්ධනය වී ඇත. එසේම 2021 වර්ෂය අවසානය වන විට පැවැති රු. බිලියන 539 ක් වූ ණය කළඹ 2021 අප්‍රේල් මස අවසානය වන විට රු. බිලියන 563 ක් දක්වා සියයට 4.4 න් ඉහළ ගොස් ඇත. 2021 සමගාමී කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 10.5 ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට 2022 අප්‍රේල් මාසය අවසානය දක්වා කාලය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 8.5 ක් ලෙස වාර්තා කර ඇත.

### සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මුල් මාස හතර තුළ රු. මිලියන 9,017 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති අතර, එය 2021 එම කාල සීමාවට සාපේක්ෂව සියයට 21 ක වර්ධනයකි. 2022 පළමු මාස හතර තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේහි මුළු ආදායම රු. බිලියන 22 ක් වූ අතර එය 2021 එම කාලසීමාවේ රුපියල් බිලියන 19 ට සාපේක්ෂව සියයට 15 ක වැඩිවීමකි. මෙම වැඩිවීම පිටුපස ඇති ප්‍රධානතම හේතුව වන්නේ සමාගමේ විදේශ මුදලින් කරන ලද ආයෝජන මත උපලබ්ධි නොවූ ලාභයයි. මෑතකදී ෆිච් රේටින් සේවාව විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේහි ජාතික රක්ෂණ මූල්‍ය ශක්තිය ශ්‍රේණිගත කිරීම ‘‘AAA (lka)’’ සිට ‘‘AA (lka)’’ දක්වා පහත හෙළා ඇත.

### ලංකා විදුලිබල මණ්ඩලය

2022 වසරේ මුල් මාස හතරක කාලපරිච්ඡේදය තුළ විදුලි කප්පාදුවීම් සිදුවූව ද විදුලිබල ඉල්ලුම ශක්තිමත්ව පැවතුන බැවින් විදුලිය අලෙවියෙන් ලද ආදායම 2021 වසරේ මුල් මාස හතරක කාලපරිච්ඡේදය තුළ දී වාර්තා කළ රු. මිලියන 80,529 ට සාපේක්ෂව රු. මිලියන 82,580 ක් දක්වා සියයට 2.5 කින් සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. ලෝක වෙළෙඳපොලේ ඉන්ධන සහ ගල් අඟුරු වල අධික මිල ඉහළයාම හා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් අදාළ කාලය සීමාව තුළ උත්පාදන පිරිවැය රු. මිලියන 59,849 සිට රු. මිලියන 100,615 දක්වා සියයට 68 කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. සීමිත විදේශ මුදල් ද්‍රවශීලතාවයන් හේතුවෙන් ඇති වූ ඇවිතෙල් ආදී විදුලිබල උත්පාදනය සඳහා අවශ්‍ය යෙදවුම් වල හිඟතාවයන් හේතුවෙන් සහ ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාවේ පිරිපහදුවේ මෙහෙයුම් ක්‍රියාකාරකම්හි බාධාවීම් මෙම කාල සීමාව තුල ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි කප්පාදුකිරීම් වලට හේතු වූ අතර, මෙමගින් රටේ ආර්ථික හා සාමාජීය කටයුතු වලට සැලකිය යුතු බලපෑමක් එල්ල වී ඇත.

උත්පාදන පිරිවැය සැලකිය යුතු ලෙස වැඩිවීම හේතුවෙන් 2021 වර්ෂයේ පළමු මාස හතර තුළ වාර්තා කළ රු. මිලියන 7,515 ක මෙහෙයුම් අලාභයට සාපේක්ෂව 2022 එම කාලපරිච්ඡේදය තුළ රු. මිලියන 47,190 ක සැලකිය යුතු මෙහෙයුම් අලාභයක් වාර්තා කර ඇත. තවද, 2021 වසරේ අදාළ කාලසීමාව තුළ කි.වො. පැයක් සඳහා රු. 18.26 ක් වූ විකුණුම් ස්ථානයේ දී ඒකක පිරිවැයට සාපේක්ෂව 2022 වසරේ එම කාලසීමාවට අදාළව විකුණුම් ස්ථානයේ දී ඒකක පිරිවැය කි.වො. පැයක් සඳහා රු. 26.96 ක් ලෙස සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. උත්පාදන සංයුතිය පිලිබඳ සැලකීමේ දී ජලයඃ තාප (ඉන්ධන)ඃ තාප (ගල් අඟුරු) ඃ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය සහ සුළං සඳහා 2021 වසරේ පළමු මාස හතර ට අදාළව 18 ඃ 29 ඃ 44 ඃ 9 අනුපාතයන් 2022 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී 20 ඃ 28 ඃ 41 ඃ 11 ලෙස වෙනස් වී ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ණය පියවීම සඳහා රජය විසින් රු. මිලියන 45,000 ක් මූල්‍යනය කිරීමත් සමග ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට සහ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන් වෙත ගෙවිය යුතු සම්පූර්ණ ණය ප්‍රමාණය 2022 වසරේ අප්‍රේල් අවසන් වන විට රු. මිලියන 121,811 දක්වා අඩු වී ඇත. ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රධාන වශයෙන් පුනර්ජනනීය බලශක්ති අංශයේ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් වෙත ගෙවිය යුතු මුදල් නොගෙවීම හේතුවෙන් එම උත්පාදකයින් දැඩි මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දී ඇත. තවද, බැංකු අයිරා ණය පහසුකම් වැඩිවීම හේතුවෙන් 2022 අප්‍රේල් මස අවසන් වන විට රාජ්‍ය බැංකු වෙත ගෙවිය යුතු ණය රු. මිලියන 115,964 දක්වා වැඩිවී ඇති අතර, ලංකා විදුලිබල මණ්ඩලය විසින් ව්‍යාපෘති ණය ඇතුළුව බැංකුවලට ගෙවිය යුතු මුළු ණය ප්‍රමාණය 2022 වසරේ අප්‍රේල් මස අවසන් වන විට රු. මිලියන 429,062 ක් වේ.

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ගෝලීය වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදන සැපයුම් දාමයේ ඇති වූ සැලකිය යුතු බාධාවන් සහ රට තුළ පවතින විදේශ විනිමය ගැටළු හේතුවෙන් ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය ප්‍රමාණය 2022 පළමු මාස හතර තුළ බැරල් මිලියන 11 කට පමණ සීමා විය. 2022 වසරේ පළමු මාස හතරේදී පසුගිය වසරේ එම කාලය තුළ අලෙවි වූ ලීටර් මිලියන 1,920 ට අමතරව නිෂ්පාදන අලෙවිය සියයට 4 ක සුළු වැඩි වීමක් පෙන්නුම් කෙරේ.

2022 පෙබරවාරි මස මුලදී, ඉන්දියානු ඔයිල් සමාගම හරහා ඇමරිකානු ඩොලර් මිලියන 500 ක ඛනිජ තෙල් නිෂ්පාදන ඉන්දීය ණය ක්‍රමයක් හරහා සැපයීම සඳහා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ගිවිසුමක් අත්සන් කළ අතර අප්‍රේල් මස අගදී ඔවුන් තවත් ඩොලර් මිලියන 200 ක ණයක් ලබා දෙමින් එම පහසුකම පුළුල් කර ඇත. ණය පහසුකම මගින් ඉන්ධන ආනයනයට ඉතා වැදගත්

රැකුලක් වූ නමුත්, බනිජ තෙල් ආනයන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් විදේශ විනිමය නොමැති වීම හා බාහිර මූල්‍ය දුෂ්කරතා මත ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට ඉල්ලුමට සරිලන ඉන්ධන සැපයුමක් ලබාදීමට මහත් ආයාසයක් දරයි.

බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක ජාත්‍යන්තර මිල 2022 වසරේ පළමු මාස හතර තුළ බැරලයක් ඇමෙරිකානු ඩොලර් 105 ක් දක්වා සියයට 24 කින් ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2021 වසරේ පළමු මාස හතරෙහි බනිජ තෙල් නිෂ්පාදනවල මුළු ආනයන වියදම වන ඇමෙරිකානු ඩොලර් මිලියන 894 හා සැසඳීමේදී, 2022 වර්ෂයේ පළමු මාස හතරේ දී එය ඇමෙරිකානු ඩොලර් මිලියන 1,254 ක් දක්වා සියයට 40 කින් වැඩි වී ඇත.

මෙම මිලකරණ සන්දර්භය තුළ, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2021 වසරේ පළමු මාස හතරේ මෙහෙයුම් අලාභය වන රු. මිලියන 15,715 ට සාපේක්ෂව 2022 වසරේ පළමු මාස හතර තුළ මෙහෙයුම් අලාභය රු. මිලියන 64,951 ක් වාර්තා කර ඇත. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි මෙහෙයුම් ශක්‍යතාවය වැඩි දියුණු කිරීමට රජය බනිජ තෙල් නිෂ්පාදන සඳහා පිරිවැය මත මිලකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කර ඇත. ඒ අනුව ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි ඍණාත්මක බලපෑම අනාගතයේදී අඩු විය හැක.

තවද, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථවෙහි ශේෂ පත්‍රයේ විදේශ විනිමය මත රඳා පවතින වගකීම් පවතින හෙයින් එහි මූල්‍ය තත්ත්වය තවදුරටත් අවධානමක පවතී. ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීමේ ප්‍රතිඵලයක් ලෙස විදේශ විනිමය පාඩුව ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථවේ තත්ත්වය තවත් දුර්වල කරයි. 2021 පළමු මාස හතර තුළ විනිමය අනුපාත පාඩුව වන රු. මිලියන 26,738 ට සාපේක්ෂව 2022 එම කාලසීමාව තුළ රු. මිලියන 549,955 ක් වාර්තා කර ඇත. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි සමස්ත අලාභය 2022 අප්‍රේල් මස අවසානයේදී රු. මිලියන 628,381 කි.

2022.04.30 දිනට රාජ්‍ය බැංකු දෙකට ගෙවිය යුතු මුළු මුදල රු. මිලියන 1,223,635 කි. එසේම, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි සමුච්චිත අලාභ සහ ඍණ ශුද්ධ වටිනාකම 2022 අප්‍රේල් මස අවසන් වන විට පිළිවෙලින් රු. මිලියන 1,047,391 ක් සහ රු. මිලියන 985,886 කි. ඒ අතරම, ප්‍රධාන වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලයෙන් සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගම වෙතින් සහ වෙනත් රාජ්‍ය ව්‍යවසායන් වෙතින් 2022 අප්‍රේල් මස අවසානයේ දී ලැබිය යුතු හිඟ මුදල රු. මිලියන 175,927 කි.

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය

කොවිඩ් 19 වසංගතය, 2021 මාර්තු මාසයේදී සුවිශාල බහාළුම් නෞකාවක් විසින් සූවස් ඇල අවහිර වීම සහ මෑතකාලීනව රුසියාව සහ යුක්රේනය අතර ඇතිවූ ගැටලු සහගත තත්ත්වය මත ඇති වූ කම්පනය ගෝලීය ආර්ථිකයට අහිතකර බලපෑමක් ඇති කරමින් ප්‍රධාන භාණ්ඩවල වෙළෙඳපොළ හිඟයක් නිර්මාණය වී ඇති අතර භාණ්ඩවල පිරිවැය වැඩිවීම කෙරෙහිද දැඩි බලපෑමක් ඇති කර ඇත. මෙම අභියෝග ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රියාකාරිත්වයට ද බලපා ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය කොළඹ, ගාල්ල සහ ත්‍රිකුණාමලය වරායන් වෙතින් 2022 මුල් මාස හතර තුළ රු. මිලියන 21,908 ක මුළු ආදායමක් උපයා ඇති අතර එයින් සියයට 97 කට වැඩි ප්‍රමාණයක් කොළඹ වරායෙනි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායමෙන් සියයට 55 ක් පර්යන්ත මෙහෙයුම් වලින් උපයනු ලබන අතර, සියයට 28 ක් ඉඩම් බදු දීමෙන් ලබන ආදායමෙන් සහ සියයට 10 ක් ආයෝජනයෙන් ලැබෙන ලාභයන්ගෙන් සමන්විත වේ. අධිකාරියේ සමස්ථ වියදම වන රු. මිලියන 10,828 න් සියයට 67 කට වඩා වැඩි ප්‍රමාණයක් සේවක පඩිනඩි සහ අතිකාල දීමනා සඳහා වැය කර ඇත. 2022 පළමු මාස හතර සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විදේශ විනිමය ලාභය ගැලපීමෙන් පසු ලබා ඇති ලාභය රු. මිලියන 14,221 කි.

ඉදිරි කාලය තුළ ආසියානු කලාපයේ සමුද්‍ර කේන්ද්‍රස්ථානය බවට පත්වීම පෙරදැරිව ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු කරමින් සිටී. නැගෙනහිර බහාලුම් පර්යන්තය අර්ධ ස්වයංක්‍රීය පර්යන්තයක් ලෙස ස්ථාපිත කිරීම මඟින් කාර්යක්ෂමතාව වැඩිදියුණු කරනු ඇති අතර කොළඹ බටහිර ජාත්‍යන්තර පර්යන්තය නවීන පර්යන්තයක් ලෙසට ක්‍රියාකරනු ඇත. නැගෙනහිර බහාලුම් පර්යන්තය අදියර දෙක ඉදිකිරීම සහ උතුරු වරාය පුළුල් කිරීම, අඛණ්ඩ ශක්‍යතා අධ්‍යයනය සහ උපදේශන කටයුතු සමඟින් බටහිර බහාලුම් පර්යන්තය දෙවන අදියර ක්‍රමානුකූලව ක්‍රියාත්මක වෙමින් පවතී. ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ දර්ශකය ඉහළ නැංවීම කෙරෙහි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අවධානය යොමුවී ඇති අතර, ඒ සඳහා ඩිජිටල්කරණය සමඟින් අවශ්‍ය සංවර්ධනය කිරීම් සඳහා අධිකාරිය යොමු වී ඇත.

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

2025 වර්ෂය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඉලක්ක සපුරා ගැනීමේදී සහ "සැමට ජලය" සඳහා වන රජයේ දැක්ම සපුරාලීමේදී, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2021 වර්ෂයේදී පිළිවෙලින් 53.7 ක් හා 93.8 ක් වූ නල ජලය සහ සුරක්ෂිත පානීය ජල සම්පාදන ආවරණය 2022 වර්ෂයේ මුල් මාස හතර තුළ පිළිවෙලින් සියයට 54.9 ක් හා සියයට 95 ක් දක්වා වැඩි කිරීමට සමත් විය.

මෙම කාලසීමාව තුළ නව සම්බන්ධතා 197,207 ක් පද්ධතියට එක් කරමින් මහා පරිමාණ ව්‍යාපෘති 3 ක්, දේශීය බැංකු යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති 6 ක් සහ "සැමට ජලය" සඳහා වන ව්‍යාපෘති 91 ක් සම්පූර්ණ කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමත් විය. එබැවින්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2021 වර්ෂයේ පළමු මාස හතර සඳහා වූ ආදායම වන රු. මිලියන 8,327 ට සාපේක්ෂව 2022 වර්ෂයේ සමගාමී පරිච්ඡේදය තුළ රු.

මිලියන 9,270 ක් දක්වා සියයට 11.3 කින් ඉහළ යන ලදි. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් පෙර වර්ෂයේ වාර්තා කරන ලද රු. මිලියන 122 ක් වූ මෙහෙයුම් ලාභයට සාපේක්ෂව සමාලෝචිත කාලසීමාව සඳහා පරිපාලන වියදම් ඉහළ යෑම හේතුවෙන් රු. මිලියන 663 ක මෙහෙයුම් අලාභයක් වාර්තා කරන ලදි. මේ නිසා, පෙර වර්ෂයේ මුල් මාස හතර තුළ වාර්තා කළ රු. මිලියන 205 ක් වූ සමස්ථ අලාභයට සාපේක්ෂව 2022 වර්ෂයේදී එම කාලසීමාව තුළ රු. මිලියන 483 ක අලාභයක් වාර්තා කර ඇත.

මේ අතර, සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා ජල නිෂ්පාදනය සහ ජල අලෙවිය පෙර වසරට සාපේක්ෂව පිළිවෙලින් සියයට 4 කින් සහ සියයට 5 කින් ඉහළ ගොස් ඇති අතර එය පිළිවෙලින් ඝන මීටර් මිලියන 275 ක් සහ ඝන මීටර් මිලියන 210 ක් විය. තවද, ආදායම් නොලබන ජලය (NRW) පෙර වර්ෂයට වඩා සෘණාත්මක ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර එය පෙර වර්ෂයේදී සියයට 24.63 ක් වූ ආදායම් නොලබන ජලය ප්‍රතිශතය ප්‍රවර්තන වර්ෂයේදී සියයට 24.01 දක්වා සුළු වශයෙන් අඩු වී ඇත.

## ගුවන් තොටුපොළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම

ගුවන් තොටුපොළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම විසින් දේශීය මෙන්ම ගෝලීය අභියෝග රැසක් මධ්‍යයේ වුවද, 2022 පළමු කාර්තුව තුළ මගීන් 900,000 කට ආසන්න ප්‍රමාණයක් හසුරුවා ඇත. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල පුළුල් කිරීම සඳහා සිදු කරන ආයෝජන මගින් අනාගත සංවර්ධන කාර්යයන් සහ ශ්‍රී ලංකාවට පැමිණෙන ව්‍යාපාරිකයන්ගේ අපේක්ෂාවන් ඉටුවෙතැයි බලාපොරොත්තු විය හැකිය. බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර අවසන් වූ පසු එමගින් ගුවන් තොටුපොළේ වාර්ෂික මගී හැසිරවීමේ ධාරිතාව දැනට පවතින මිලියන 6 මට්ටමේ සිට මිලියන 15 දක්වා වැඩි වනු ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය විසින් රු. බිලියන 6.1 ක අරමුදල් සපයා ඇත.

ඉහත පරිදි ගුවන් තොටුපොළ පුළුල් කිරීම හේතුවෙන් වාහන නැවැත්වීමේ අංගන ධාරිතාව 49 දක්වා වැඩි වනු ඇත. තවද, ව්‍යාපෘතිය අවසන් වීමත් සමගම පිරික්සුම් කවුන්ටර සංඛ්‍යාව 149 දක්වා ඉහළ යනු ඇති අතර, ආගමන කවුළු සංඛ්‍යාව 27 සිට 83 දක්වා වැඩි වනු ඇත. ගුවන් බස් පිවිසුමේ ධාරිතාවද හතරේ සිට 10 දක්වා වැඩි වනු ඇත. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ගුවන් තොටුපොළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම විසින් ගගන නාවික ආදායම වශයෙන් රු. මිලියන 2,102 ක්, ගගන නාවික නොවන ආදායම වශයෙන් රු.මිලියන 7,273 ක් සහ අනෙකුත් ආදායම වශයෙන් රු. මිලියන 55 ක් ද ඇතුළුව රු. මිලියන 9,430 ක මුළු ආදායමක් උපයා ඇති අතර එය එම කාලසීමාව සඳහා ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 30 කින් වැඩි ය. එම කාලපරිච්ඡේදය තුළ දී ගුවන් තොටුපොළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගමේ මුළු වියදම රු. මිලියන 5,719 ක් වන අතර, එය එම කාලසීමාව සඳහා පවතින ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 12 කින් අඩු අගයකි. කෙසේවෙතත්, රු. මිලියන 11,143 ක් වූ මෙහෙයුම් හා පරිවර්තන මත විනිමය පාඩුව ගුවන් තොටුපොළ හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගමේ කාර්යසාධනය කෙරෙහි ඍජුවම බලපා ඇති අතර, එමගින් රු. මිලියන 3,711 ක් ව පැවති මෙහෙයුම් අලාභය රු. මිලියන 6,407 ක බඳු පෙර අලාභයක් බවට පත් වී ඇත.

## ශ්‍රී ලංකන් ගුවන් සමාගම

ශ්‍රී ලංකන් ගුවන් සමාගම සතුව රු. මිලියන 618,677.61 ක වගකීම් පවතින අතර, එම බැඳීම් ප්‍රමාණය ඇ.ඩො. මිලියන 175 ක ස්වෛරීත්ව බැඳුම්කරය, භාණ්ඩාගාර සුරැකුම්පත් මගින් සහතික කළ රාජ්‍ය බැංකුවලින් ලබාගත් ණය, ගුවන්යානා කල්බදු සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වැනි වෙළෙඳ ණය හිමියන්ට ඇති ගෙවීම්වලින් සමන්විත වේ. මෙබඳු තත්ත්වයක් තුළ රාජ්‍ය බැංකු දෙක හරහා ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ අලාභදායීත්වයට පිළියම් යෙදීමට රජයට තවදුරටත් හැකියාවක් නොපවතින බැවින් එම සමාගමේ වගකීම් සම්බන්ධයෙන් කඩිනම් විසඳුමක අවශ්‍යතාව පවතී. ශ්‍රී ලංකා ගුවන් සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා මෙහෙයුම් ක්‍රියාවලිය ලාභදායකත්ව ආකෘතියකට පරිවර්තනය කිරීම හදිසි අවශ්‍යතාවයක් ලෙස පවතී.

2022 පළමු මාස හතර තුළ ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් උපයන ලද ආදායම රු. මිලියන 71,825 ක් වන අතර මුළු පිරිවැය රු. මිලියන 320,266 ක් වේ. ඒ අනුව, සලකා බලන කාලපරිච්ඡේදය තුළ ලැබූ අලාභය රු. මිලියන 248,441 කි. කෙසේවෙතත්, 2022 මාර්තු මාසයේදී ශ්‍රී ලංකන් ගුවන් සමාග මට අත්විඳීමට සිදුවූ විනිමය අලාභය රු. බිලියන 145 ක් වේ.

**වගුව 3.1: රජය සතු ප්‍රධාන ව්‍යාපාරවල ප්‍රතිසංස්කරණ/ප්‍රධාන පියවර**

| ආයතනය | ප්‍රතිසංස්කරණ/ප්‍රධාන පියවර |
|---|---|
| රාජ්‍ය බැංකු:<br>(ලංකා බැංකුව, මහජන බැංකුව<br>සහ<br>ජාතික ඉතිරි කිරීමේ බැංකුව) | ❖ ණය කළඹේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ සුපරීක්ෂණය සහ නැවත අයකරගැනීම වර්ධනය කිරීම.<br>❖ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් වන රාමුව ශක්තිමත් කිරීම.<br>❖ මෙහෙයුම් පිරිවැය අඩු කිරීම සහ පාරිභෝගික අපේක්ෂාවන් සපුරාලීම සඳහා තාක්ෂණික හැකියාවන් වර්ධනය කිරීම.<br>❖ පවත්නා ගනුදෙනුකරුවන් වෙත සහය දීමට සහ නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා නව නිෂ්පාදන සංවර්ධනය කිරීම. |
| සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | ❖ අඩු පහසුකම් සහිත ප්‍රදේශවල සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ශාඛා ජාලය පුළුල් කිරීමට ආයෝජනය කිරීම.<br>❖ අඩු වියදම් ශාඛා ආකෘතියකට මාරු වීම.<br>❖ පාර්ශවකරුවන්ට විවිධ අගයන් පිරිනමමින් සන්නාමෙහි පිළිගැනීම පවත්වා ගැනීම.<br>❖ ව්‍යාපාරයේ ඵලදායිතාව සහ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා නව ඩිජිටල් විසඳුම් හඳුනාගෙන වේගවත් ඩිජිටල් විසඳුම් ක්‍රියාත්මක කිරීම.<br>❖ ලාභාංශ මත පදනම් වූ ජීවිත රක්ෂණ සැලැස්මක් සකස් කිරීම.<br>❖ ප්‍රතිපත්ති ලේඛනය ඩිජිටල් ආකාරයෙන් යැවීම (ඊ-ප්‍රතිපත්ති).<br>❖ ඩිජිටල් මාධ්‍ය හරහා පාරිභෝගික දැන්වීම් යැවීම.<br>❖ පාරිභෝගික යෙදුමේ විශේෂාංග වැඩි දියුණු කිරීම. |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | ❖ රජය විසින් පිරිවැය පරාවර්තක මිලකරණ යාන්ත්‍රණයක් ආරම්භ කරන ලදී.<br>❖ ඉන්ධන ආනයනය විවෘත කිරීමට කැබිනට් අනුමැතිය ලබා දීම. |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | ❖ ශ්‍රී ලංකා වරාය අධිකාරිය කොළඹ වරායේ පෞද්ගලික මෙහෙයුම්කරුවන් සහ අනෙකුත් ආසියානු වරායන්හි තීරුබදු ව්‍යුහයේ වෙනස්කම් පරීක්ෂා කර ඇති අතර අනෙකුත් වරායන් සමඟ තරඟකාරී වන පරිදි තීරුබදු අනුපාත සංශෝධනය කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී. මේ සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා දීමට නියමිතයි.<br>❖ වරාය අධිකාරිය කොළඹ වරායෙහි බටහිර වරාය පර්යන්ත අදියර දෙකෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. දැනට වානේ ආකෘති සහ දොඹකර ද්‍රව්‍ය ඉදිකිරීම සහ ගොඩකිරීමේ කටයුතු ක්‍රියාත්මක තත්ත්වයේ පවතී.<br>❖ වරාය මෙහෙයුම් සහ සේවාවන්හි ගුණාත්මක භාවය ඉහළ නැංවීමේ අරමුණින් වරාය අධිකාරිය විසින් වංචා සහ දූෂණවලට එරෙහිව පැමිණිලි කිරීමට පහසු යාන්ත්‍රණයක් හඳුන්වා දී ඇත. ඒ අනුව, වරායේ පවතින ගැටලු පිළිබඳ, ඕනෑම අයෙකුට ශ්‍රී ලංකාවේ වරායන්හි මෙහෙයුම් සහ සේවාවන්හි කිසියම් වංචාවක් සම්බන්ධව දුරකථන අංක +94716413332 මඟින් වට්ස්ඇප් (WhatsApp) හරහා පැමිණිල්ලක් ගොනු කිරීමට හැකියාව පවතී. |
| සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම | ❖ රජයේ ප්‍රසම්පාදන ප්‍රතිපත්ති උල්ලංඝනය නොවන පරිදි ශ්‍රී ලංකා ගුවන් සමාගමේ කාර්යසාධනයට සිදු වන බාධා නැවැත්වීම සඳහා ආයතන විශේෂිත ප්‍රසම්පාදන අත්පොත ශ්‍රී ලංකා ගුවන් සමාගම සඳහා හඳුන්වාදීමට කැබිනට් මණ්ඩලය තීරණය කර ඇති අතර එම අත්පොත අනුමත කිරීමේ ක්‍රියාවලිය රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සිදු කරමින් පවතී.<br>❖ ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ රජය සතු කොටස් සඳහා පෞද්ගලික අංශයේ ආයෝජනයක් ලබා ලබාගැනීම තුළින් රජයේට ඇති වැය බර අඩු කරගන්නට කටයුතු කරන බව ගරු අග්‍රාමාත්‍ය තුමා දැනුම් දී ඇත. මේ වන විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා බහු පාර්ශවීය ආධාර සපයන ආයතන සමඟ මේ සඳහා ක්‍රමවේදයක් සකස්කරමින් පවතී.<br>❖ රජයේ ණය ආපසු ගෙවීම තාවකාලිකව අත්හිටවීමේ ප්‍රතිපත්තියත් සමග ස්වෛරීත්ව බැඳුම්කර සඳහා රු. මිලියන 175 ක පොලී ගෙවීම් නවත්වා ඇත. |
| සීමාසහිත ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | ❖ බණ්ඩාරනායක ගුවන් තොටුපල පුළුල් කිරීමේ II අදියර ක්‍රියාත්මක වෙමින් පවතී.<br>❖ රජයේ ණය ආපසු ගෙවීම අත්හිටුවීමේ ප්‍රතිපත්තියත් සමග මත්තල ගුවන්තොටුපල සහ බණ්ඩානායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ධාවන පථය සඳහා ලබාගත් ස්වෛරීත්ව ණය ආපසු ගෙවීම් අත්හිටුවා ඇත. |

මූලාශ්‍ර : රාජ්‍ය ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

## වගුව 3.2: ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52හි ලාභදායීත්වය

රු.මිලියන

| | රාජ්‍ය ව්‍යාපාරය | 2020[අ] | 2021[අ] | 2022.04.30 දක්වා [අ] |
|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | 23,552 | 43,190 | 19,919 |
| 2 | මහජන බැංකුව | 21,227 | 30,387 | 9,610 |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 15,645 | 28,555 | 8,590 |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 790 | 845 | 243 |
| 5 | නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව | 1,381 | 1,267 | 303 |
| 6 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 2,061 | 2,651 | 670 |
| 7 | සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය | 32,500 | 33,159 | 2,972 |
| 8 | සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 7,972 | 11,725 | 9,017 |
| 9 | ජාතික රක්ෂණ භාරකාර අරමුදල | 8,866 | 5,936 | 2,812 |
| 10 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 265 | 310 | 159 |
| 11 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 1,257 | 1,780 | 181 |
| 12 | ලංකා විදුලිබල මණ්ඩලය | -60,486 | -21,450 | -47,190 |
| 13 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 2,371 | -82,208 | -628,381 |
| 14 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 20,328 | 25,601 | 14,221 |
| 15 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 643 | -2,996 | -483 |
| 16 | සීමාසහිත ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | -3,733 | -755 | -6,407 |
| 17 | සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම | -45,230 | -170,751 | -248,441 |
| 18 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | -2,105 | -3,143 | -599 |
| 19 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | -1,066 | -1,020 | -215 |
| 20 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 261 | 250 | -41 |
| 21 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | -257 | 43 | 74 |
| 22 | සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම | 230 | 330 | -131* |
| 23 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 0 | 158 | 444 |
| 24 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | -150 | -232 | 3.7 |
| 25 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | -351 | -481 | -22.4 |
| 26 | සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම | 214 | 468 | 204 |
| 27 | සීමාසහිත හලාවත වැවිලි සමාගම | 283 | 511 | 139** |
| 28 | සීමාසහිත කළුබෝවිටියන තේ කර්මාන්තශාලාව | 43 | -15 | 0.57** |
| 29 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 15 | 16 | 2 |
| 30 | සීමාසහිත ලංකා ඛනිජ වැලි සමාගම | 69 | 1,205 | 310 |
| 31 | සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | 150 | 117 | 157** |
| 32 | සීමාසහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | 14 | 4 | 7.7** |
| 33 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 2,994 | 2,954 | 1,409 |
| 34 | ජාතික ලොතරැයි මණ්ඩලය | 1,435 | 1,003 | 444 |
| 35 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 1,161 | 1,238 | 563 |
| 36 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | 9 | -21 | 59 |
| 37 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 2,546 | 3,157 | 209 |
| 38 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 174 | -258 | -50 |
| 39 | සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය | -251 | -344 | -102 |
| 40 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | -236 | -224 | -125 |
| 41 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | -2 | 9 | -52 |
| 42 | සීමාසහිත ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | -106 | -35 | -17.3 |
| 43 | රාජ්‍ය දැව සංස්ථාව | 464 | 1,236 | 186 |
| 44 | ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | -120 | 63 | 126 |
| 45 | සීමාසහිත ලංකා සතොස සමාගම | -1,386 | -880 | -118.7 |
| 46 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | -44 | -208 | -57 |
| 47 | ලංකා ධීවර සංස්ථාව | -48 | -63 | -31 |
| 48 | ලංකා ධීවර වරාය නිෂ්පාදන නීතිගත සංස්ථාව | -236 | -140 | -9 |
| 49 | සීමාසහිත ලංකා පොහොර සමාගම | 98 | 124 | 61.3 |
| 50 | සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 163 | 260 | 166.7 |
| 51 | සීමාසහිත හොටෙල් ඩිවලොපර්ස් ලංකා ලිමිටඩ් | -877 | -947 | -52 |
| 52 | සීමාසහිත ලංකා සීනි සමාගම | 1,171 | 1,577 | 391 |
| | **එකතුව** | **33,668** | **-86,042** | **-858,870** |

මූලාශ්‍ර : රාජ්‍ය ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේනතුව
[අ] තාවකාලික
*2022.02.28 දිනට ලාභය (2022 ජනවාරි සිට පෙබරවාරි දක්වා)
** 2022.03.31 දිනට ලාභය (2022 ජනවාරි සිට මාර්තු දක්වා)

## වගුව 3.3: රාජ්‍ය ව්‍යාපාර වෙතින් ලද අයබදු/ලාභාංශ ආදායම

රු.මිලියන

| | 2020 | 2021 | 2022.04.30 දක්වා |
|---|---|---|---|
| අයබදු | **14,769** | **25,919** | **9,561** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 1,000 | 3,500 | - |
| ලංකා බැංකුව | 1,250 | 1,500 | - |
| මහජන බැංකුව | 2,500 | 1,977 | - |
| විදුලි සංදේශ හා නියාමන කොමිසම | 5,000 | 8,500 | 5,700 |
| රාජ්‍ය දැව සංස්ථාව | - | 100 | - |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | - | 100 | 100 |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 782 | 1,824 | 1,508 |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | - | 2,000 | 650 |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | - | 15 | 25 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 156 | - | 416 |
| ජාතික ලොතරැයි මණ්ඩලය | - | 900 | 261 |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | - | 25 | - |
| ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය | - | 25 | - |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | - | 50 | - |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | - | - | 128 |
| ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | - | 110 | 290 |
| ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 81 | 147 | 400 |
| මාර්ග සංවර්ධන අධිකාරිය | 4,000 | 4,000 | - |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | - | 1,100 | - |
| සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | - | 25 | - |
| ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය | - | 16 | 33 |
| ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | - | 5 | - |
| කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය | - | - | 50 |
| ලාභාංශ | **2,854** | **4,672** | **1,838** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 60 | 60 | 30 |
| ලංකා බැංකුව | 346 | 346 | 173 |
| මහජන බැංකුව | 316 | 316 | 158 |
| සීමාසහිත ජාතික සංවර්ධන බැංකුව | 1 | 1 | 0.9 |
| සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 695 | 899 | 755 |
| සීමාසහිත ලංකා ඛනිජ වැලි සමාගම | - | 700 | 359 |
| සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | - | 20 | 15 |
| සීමාසහිත ලංකා ලේලන්ඩ් සමාගම | 2 | 3 | - |
| සීමාසහිත මාන්තායි සෝල්ට් සමාගම | 2 | 14.8 | - |
| සීමාසහිත ලංකා පොහොර සමාගම | 304 | 29 | - |
| සීමාසහිත පරන්තන් කෙමිකල් සමාගම | 10 | 3 | 50 |
| සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 947 | 1,331 | - |
| සීමාසහිත ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | - | 345 | - |
| සීමාසහිත ලංකා විදුලිබල සමාගම | - | 327 | 218 |
| සීමාසහිත ලංකා කාර්මික වතු සමාගම | 82 | 82 | - |
| සීමාසහිත ලංකා කෘෂි කර්මාන්ත සමාගම | 77 | 95 | 24 |
| වැවිලි සමාගම් | 12 | 98 | 48 |
| වෙනත් | - | 2.2 | 7 |
| එකතුව | **17,623** | **30,591** | **11,399** |

මූලාශ්‍ර : රාජ්‍ය ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

# 4 වන පරිච්ඡේදය
# විදේශ මූල්‍යයනය

## සමාලෝචනය

විදේශ මූල්‍යයනය ඒකරාශී කිරීම සඳහා 2021 වර්ෂයේදී නව්‍යකරණය කරන ලද ප්‍රතිපත්තිවලට අනුව, ණය නොවන ව්‍යාපෘති දිරිගැන්වීමට සමගාමීව ණය අඩු කිරීම සඳහා රජය විසින් ඉදිරියේදී අත්සන් කිරීමට නියමිත ව්‍යාපෘතිවල ප්‍රමුඛතාවය නැවත සලකා බලන ලදි. ඒ අනුව, 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලයේ දී රජය අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය හා අධ්‍යාපන අංශය සඳහා විදේශ ණය ලබා ගන්නා ලදි.

## විදේශ මූල්‍යයන එකඟතා

රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා අවශ්‍ය විදේශ අරමුදල් සම්පාදනය කිරීම වෙනුවෙන් රජය විවිධ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන සමග 2022 වර්ෂයේ පළමු මාස 4 දී විදේශ මූල්‍යයන එකඟතා ගිවිසුම් 4 ක් මගින් එ.ජ.ඩොලර් මිලියන 1,550.5 ක එකඟතා ඇතිකරගෙන ඇත. මෙයින් එ.ජ.ඩොලර් මිලියන 1,500.0 ක් ඉන්දියානු අපනයන වෙළෙඳ ණය මාලාව යටතේ ඉන්දියානු ආනයන අපනයන බැංකුව හා ඉන්දියානු රාජ්‍ය බැංකුව මගින් අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා ලබාගත් ණය පහසුකමකින් ද, එ.ජ.ඩොලර් මිලියන 32.9 ක් කුවේට් රාජ්‍යයෙන් මොරටුව සරසවියේ වෛද්‍ය පීඨයක් ඉදිකිරීම සඳහා ලබාගත් ණය පහසුකමකින් ද, මාතර වෘත්තීය පුහුණු ආයතනය ඉදිකිරීම සඳහා කුවේට් රජයෙන් ලබාගත් එ.ජ.ඩොලර් මිලියන 17.6 කින් ද සමන්විත වේ.

විදේශ අරමුදල් ඒකරාශී කිරීමෙහිලා රටේ පැවති ආර්ථික අස්ථායීතාවය විශාල ලෙස බලපාන ලදි.

## විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2022 ජනවාරි 01 සිට අප්‍රේල් 30 දක්වා, මුළු විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණය වන එ.ජ.ඩොලර් මිලියන 968.8 න් එ.ජ.ඩොලර් මිලියන 968.1ක් ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වන අතර එ.ජ.ඩොලර් මිලියන 0.7 ක් ප්‍රදාන ලෙස ද ප්‍රතිලබ්ධි වේ.

මෙම ප්‍රතිලබ්ධිවලින් ඉහළම ප්‍රමාණය ඉන්දියාව සමග අත්සන් කරන ලද ණය ගිවිසුම් මගින් ලබා ගත් අතර, එය සමස්තයෙන් ආසන්න වශයෙන් සියයට 39 ක් ද අනතුරුව ඉහළම ප්‍රමාණයක් ආසියානු සංවර්ධන බැංකුව (සියයට 37) සහ චීනය (සියයට 7) සමග අත්සන් කරන ලද ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වේ.

මෙම වර්ෂයේ සිදු වූ ප්‍රතිලබ්ධිවලින් ඉහළ ප්‍රමාණයක් විදුලිබල හා බලශක්ති අංශයේ (සියයට 41.57) ව්‍යාපෘතිවල උපයෝජනය පිණිස යොදවා ඇති අතර, අනතුරුව ඉහළ ප්‍රමාණයක් මාර්ග හා පාලම් (සියයට 21.5), සෞඛ්‍යය හා සමාජ සුබසාධනය (සියයට 10.97), ජලසම්පාදනය හා සනීපාරක්ෂාව (සියයට 6.32), වාරිමාර්ග (සියයට 6.07), ප්‍රවාහනය (සියයට 5.5) සහ අධ්‍යාපනය (සියයට 3.13) යන අංශ යටතේ ක්‍රියාත්මකවන ව්‍යාපෘතිවල උපයෝජනය පිණිස යොදවා ඇත.

**වගුව 4.1: එක් එක් සංවර්ධන පාර්ශ්වකරු විසින් 2022 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා සිදු කරන ලද ප්‍රතිලබ්ධි**


| සංවර්ධන පාර්ශ්වකරු | ප්‍රතිලබ්ධි ප්‍රමාණය (එ.ජ.ඩොලර් මිලියන)* | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්විපාර්ශ්වික** | **536.0** | **0.7** | **536.7** |
| චීනය | 67.9 | | 67.9 |
| ජපානය | 42.3 | | 42.3 |
| ප්‍රංශය | 20.8 | | 20.8 |
| ඉන්දියාව | 376.9 | | 376.9 |
| නෙදර්ලන්තය | 13.7 | | 13.7 |
| එක්සත් රාජධානිය | 2.3 | | 2.3 |
| කුවේටය | 5.1 | | 5.1 |
| ඔස්ට්‍රියාව | 0.71 | | 0.7 |
| කොරියාව | 2.1 | | 2.1 |
| ස්පාඤ්ඤය | 1.3 | | 1.3 |
| ජර්මනිය | | 0.7 | 0.7 |
| හංගේරියාව | 2.9 | | 2.9 |
| **බහුපාර්ශ්වික** | **432.1** | | **432.1** |
| ලෝක බැංකුව | 67.3 | | 67.3 |
| ආසියානු සංවර්ධන බැංකුව | 359.6 | | 359.6 |
| ඔපෙක් අරමුදල | 2.4 | | 2.4 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 2.7 | | 2.7 |
| **එකතුව** | **968.1** | **0.7** | **968.8** |

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සටහන: එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේදී 2022 අප්‍රේල් 30 දින පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.

* තාවකාලික අගයයන්

**රූප සටහන 4.1: එක් එක් අංශය වෙනුවෙන් 2022 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා සිදු වූ ප්‍රතිලබ්ධි (එ.ජ.ඩොලර් මිලියන)**




මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

**වගුව 4.2:** 2022 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා ඇතිකර ගත් විදේශ මූල්‍යයන එකඟතා, අදාළ මූල්‍ය කොන්දේසි සමග

| සංවර්ධන පාර්ශ්වකරු/ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය වැඩසටහන හෝ ණය | විනිමය | එකඟතා ප්‍රමාණය (මිලියන) අත්සන් කරන ලද විනිමයෙන් | රුපියල් | ඇ.එ.ජ. ඩොලර් | මූල්‍ය කොන්දේසි පොලිය වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | වෙනත් ගාස්තු | වෙනත් කොන්දේසි සහන කාලය (වර්ෂ) | පරිණත කාලය/ උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ද්විපාර්ශ්වික | | | | | | | | | | | | | |
| කුවේට් | ණය | 2022.02.03 | මොරටුව විශ්ව විද්‍යාලය සඳහා වෛද්‍ය පීඨයක් ඉදිකිරීම සහ උපකරණ සැපයීමේ ව්‍යාපෘතිය | කුවේට් ඩිනාර් | 10 | 6,638.90 | 32.9 | ස්ථාවර | - | 1 | පොරොන්දු ගාස්තු 0.5% | 6 | 26 |
| ඉන්දියාව | ණය | 2022.02.02 | ඉන්දියානු ආනයන අපනයන බැංකු සහාය යටතේ ඛනිජ තෙල් නිෂ්පාදන මිලදී ගැනීම සඳහා කෙටි කාලීන ණය මාලාව (එ.ජ.ඩො.මිලියන 500) | එ.ජ.ඩො. | 500 | 100,710.30 | 500 | විචල්‍ය | SOFR 6M | 1.5 | පොරොන්දු ගාස්තු 0.5% | 1 | 1 |
| | ණය | 2022.03.17 | අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා ඉන්දියානු ණය යෝජනා ක්‍රමය (එ.ජ.ඩො.මිලියන 1000) | එ.ජ.ඩො. | 1,000 | 267,862.00 | 1,000 | විචල්‍ය | SOFR 3M | 1.6 | | 3 | 3 |
| ජර්මනිය | ණය | 2022.01.27 | මාතර වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා මූල්‍යාධාර ලබාගැනීම | යුරෝ | 15.7 | 3,561.60 | 17.6 | ස්ථාවර | - | 2 | | 10 | 30 |
| **එකතුව** | | | | | | 378,772.80 | 1,550.50 | | | | | | |

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සටහන : එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන එකඟතා අගයයන් එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේ දී අදාළ ගිවිසුම් අත්සන් කරන ලද දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.


SOFR- විචල්‍ය අනුපාතිකයකි.

## ඒකඟතා පළකරන ලදුව ඉදිරියේ දී උපයෝජනය වීමට නියමිත ශේෂය

දැනට පළ කර ඇති ඒකඟතා අනුව ඉදිරි වර්ෂ 3-5 කාලය තුළ විවිධ ව්‍යාපෘති හා වැඩසටහන්වල උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයනවල ශේෂය 2022 අප්‍රේල් 30 දින වන විට එ.ජ.ඩොලර් මිලියන 8,054.3 ක් විය. මෙයින් ඉහළම ප්‍රමාණය ඉන්දියාව විසින් ලබා දීමට නියමිත අතර, අනතුරුව ඉහළ ප්‍රමාණයන් පිළිවෙලින් ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, චීනය සහ ජපානය ලබා දීමට නියමිතය.


ඒකඟතා පළකරන ලදුව ඉදිරියේ දී උපයෝජනය වීමට නියමිත ශේෂයෙන් සියයට 21 ක් මාර්ග හා පාලම් අංශයේ ද ජල සම්පාදනය හා සනීපාරක්ෂාව අංශයේ සියයට 16 ක් හා සියයට 13 ක් වෙළෙඳ අංශයේ ඒකඟතා පළ කරන ලද ව්‍යාපෘතිවල උපයෝජනය වීමට නියමිතය.

**රූප සටහන 4.2: පළ කරන ලද ඒකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය එක් එක් සංවර්ධන පාර්ශ්වකරු අනුව (එ.ජ.ඩොලර් මිලියන)**




මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

**රූප සටහන 4.3:** 2022 අප්‍රේල් 30 වන විට අංශ අනුව පළ කරන ලද ඒකඟතා මත ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය (එ.ජ.ඩොලර් මිලියන)





මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

## විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ වැඩසටහන් සැළසුම් කිරීමේදී සහ හදිසි මූල්‍යාධාර සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ලබා ගැනීමේ හැකියාව කෙරෙහි රජයේ අවධානය යොමුකර ඇති අතර ශ්‍රී ලංකාවේ බාහිර විදේශීය ණය සම්පූර්ණයෙන්ම තිරසාර තත්ත්වයකට පත්කර ගැනීම / ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා පුළුල් සැලැස්මක් ණය හිමියන් / සංවර්ධන පාර්ශ්වකරුවන් වෙත සම්පාදනය කිරීමේ අරමුණින් හැකි ඉක්මනින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සාකච්ඡා කිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනට අනුකූල වන පරිදි එම බැඳීම් ක්‍රමානුකූලව සහ ඒකඟතාවයෙන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා 2022 අප්‍රේල් 12 වන දින සිට ආරම්භ වන අන්තර් කාල සීමාවන් සඳහා ද්විපාර්ශ්වික සහ වාණිජ ණය හිමියන්ගේ ණය සේවාකරණය තාවකාලිකව අත්හිටුවීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත.

2022 අප්‍රේල් 30 වන විට රජය ලබාගත් විදේශ ණය මූල්‍යයනයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 35.04[1] කි. තවද 2022 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා සිදු කරන ලද ණය සේවාකරණය[2] එ.ජ.ඩොලර් මිලියන 1,443.7 කි. මෙයින්, එ.ජ.ඩොලර් මිලියන 1,084.2 ක් ණය ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන එ.ජ.ඩොලර් මිලියන 359.6 පොලී ගෙවීම සඳහා යොදවා ඇත.

**රූප සටහන 4.4:** 2022 අප්‍රේල් 30 වන විට සිදුකර ඇති ණය සේවාකරණය හා වර්ෂයේ ඉදිරි මාස 8 සඳහා පුරෝකතනය[3] කරන ලද ණය සේවාකරණ ගෙවීම් (එ.ජ.ඩොලර් මිලියන)




මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

[1] භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් හි අනේවාසික ආයෝජන හා රාජ්‍ය ව්‍යාපාර සඳහා ලබාගත් ණය අඩංගු නොවේ.

[2] මුළු ණය සේවාකරණය පොලී ගෙවීම, ණය වාරික ගෙවීම, රාජ්‍ය ව්‍යාපාරයන් හි ණය සේවාකරණය අඩංගු නොවේ. රූපසටහනෙන් දක්වා ඇති පුරෝකථන අගයයන් සඳහා ණය ගෙවීම් පිළිබඳ නිකුත් කළ ප්‍රතිපත්තිමය තීරණය බලපානු ඇත.

[3] පුරෝකථනය කර ඇත්තේ 2022 අප්‍රේල් 30 පැවති විනිමය අනුපාතයන් අනුව වේ. පුරෝකථන සඳහා දැනට ඇති ණය ප්‍රමාණය පමණක් පදනම් කරගෙන ඇති අතර 2022 වර්ෂයේ සිදුවන නව ණය ගැනීම් අනුව එකතුවන ණය සේවාකරණ ගෙවීම පුරෝකථන අගයන් එකතුකර නැත.